

කාර්යසාධන වාර්තාව
2022

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07

දුරකථන : **011 2337350**

ෆැක්ස් : **011 2337355**

විද්‍යුත් තැපෑල : **dba.gov.lk@gmail.com**

වෙබ් අඩවිය : **dba.gov.lk**

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂය අංකය - 201

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පටුන

පිටු අංකය

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01.01 හැඳින්වීම 1-2
01.02 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3
01.03 ප්‍රධාන කාර්යයන් 3
01.04 සංවිධාන සටහන 4
01.05 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ප්‍රාදේශීය කාර්යාල 5-45

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

02.01 2022 වසරේ ක්‍රියාත්මක ව්‍යාපෘති හා වැඩසටහන් 46
02.02 2023 දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති හා වැඩසටහන් 47

3. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය
03.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය 48
03.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 49
03.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 50-51
03.4 ආදායම් එකතු කිරීමේ ප්‍රකාශය 52
03.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගීකර ගැනීමේ කාර්යසාධනය 52
03.6 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිත යෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 52
03.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 52
විගණකාධිපති වාර්තාව

4. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

04.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය 61

5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු

05.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර අරමුණු 62
05.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 62

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 64
06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය 64
06.3 මානව සම්පත් සංවර්ධනය 64

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

07.1අනුකූලතා වාර්තා 65-70

01. පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති පරිදි බුද්ධාගම ප්‍රමුඛස්ථානයෙහි තබා ශ්‍රී සම්බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීමේ රාජ්‍ය වගකීම ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වශයෙන්ම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා සහ දැහැමි බෞද්ධ සමාජයක් පවත්වා ගෙන යාමට අදාල කාලීන ව්‍යාපෘතීන් රාශියක් ඉටු කරන අතරම, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහය ලබා දීම, විහාරස්ථාන සංවර්ධනය කිරීම, දහම් පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා දිවයිනේ සියලුම සාමණේර/උපසම්පදා භික්ෂූන් ලියාපදිංචි කර ලේඛන පවත්වා ගෙන යාම සිදු කරනු ලැබේ.

සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීම සඳහා එවකට පත් කරන ලද කමිටු නිර්දේශයක ප්‍රතිඵලයක් වශයෙන් 1981 ජුනි 01 දින බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. එතෙක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මහාභාරකාර දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ආදී රාජ්‍ය දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරන ලද බුද්ධ ශාසනයට අදාළ කාර්යයන් ද ඇතුළත්ව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා අභිවෘද්ධිය උදෙසා වූ කටයුතු රාශියක් මෙම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ ස්ථාපිත කර ඇති අතර, එම අංශ වෙත අදාළ කාර්යයන් පවරා ඇත. විහාර දේවාලගම් ආඥා පනතට අදාල කටයුතු දුර බැහැර සිද්ධස්ථානවාසී ස්වාමීන් වහන්සේලාට ඉටු කර ගැනීම පහසු කරනු වස් මහනුවර, කුරුණෑගල හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කර ඇත. බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, උන්නතිය හා ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන කාර්යයන් මෙම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් පාලනය යටතේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට බස්නායක නිලමේවරුන් / භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම,බෞද්ධ සිද්ධස්ථාන වල දේපල පරිපාලනයට අවශ්‍ය සහය ලබාදීම, (මෙහිදි සිද්ධස්ථාන සන්තක ඉඩම් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දී එම සිද්ධස්ථාන වලට ආදායම් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම, සඟ සතු නිශ්චල දේපල වල සුරක්ෂිත භාවය සඳහා කටයුතු යෙදීම, සිද්ධස්ථාන සන්තක දේපල වල ආරවුල් නිරවුල් කිරීමට මැදිහත් වීම ආදී කාර්යයන් වේ),දිවයිනේ සියළුම විහාරස්ථාන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා අදාල නිකායේ මහානායක ස්වාමීන් වහන්සේ පත්කළ විහාරාධිපති තනතුරු පිළිගැනීම, භික්ෂූන් වහන්සේලාගේ සාමණේර හා උපසම්පදා සහතික ලියාපදිංචි කිරීම, බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ හැඳුනුම්පත් සකස් කිරීම, විහාරස්ථාන සතු දේපල හා බැංකු ගිණුම් වල ඇති මුදල් සම්බන්ධ කටයුතු ආදිය විහාර දේවාලගම් අංශය යටතේ සිදුකරනු ලබයි.

සංවර්ධන අංශය යටතේ ශාසන චිරස්ථිතිය උදෙසා විහාරස්ථාන ආධාර, සිවුපස ආධාර, ආර්ථික දුෂ්කරතා පවතින විහාරස්ථාන සඳහා ආධාර කිරීම, ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවීමට අදාල කටයුතු, ස්වාමීන් වහන්සේලාගේ ආදාහන කටයුතු සඳහා ආධාර කිරීම, නිදහස් දිනය, වෙසක් දිනය, පොසොන් දිනය සැමරීම සඳහා විවිධ කාර්යයන් ඉටු කිරීම, විහාරස්ථාන කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම, විහාරස්ථාන සඳහා සහන ගාස්තු මත දුරකථන, ජලය, විදුලිය, වැනි පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම, නිකාය හා නිකාය පාර්ශවයන් පිළිබඳ කටයුතු, කුල දරුවන් පැවිදි කිරීම හා උපසම්පදා කිරීම, නිකාය මූලස්ථාන සඳහා ගෙවීම් කටයුතු (රියදුරු/කම්කරු) , ලේඛකාධාර යටතේ පොත් මිලදී

ගැනීම් කටයුතු, දසසිල් මාතාවන් පිළිබඳ කටයුතු, ආරාම ලියාපදිංචි කිරීම, හැදුනුම්පත් නිකුත් කිරීම, අධ්‍යාපන ආයතන සම්බන්ධ කටයුතු, රැස්වීම් පිළිබඳ කටයුතු හා සංඝමිත්තා ගුණ සැමරුම, සිල්මාතා පුහුණු ආයතන ඇති කොට පවත්වාගෙන යාම ආදී පුළුල් පරාසයක විහිදුණු කටයුතු පවතී.
දහම් පාසල් අංශය මඟින් පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කෙරේ

- ශාසනාරක්ෂක මණ්ඩලය පවත්වා ගෙන යාම හා ක්‍රියාත්මක කිරීම.
- දහම් පාසල් කටයුතු
- දහම් පාසල් පොත් මුද්‍රණය කර බෙදා හැරීම.
- දිවයින පුරා දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම.
- දහම් පාසල් සිසු කුසලතා ඇගයීමේ වැඩසටහන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා මට්ටමින් පැවැත්වීම.
- දහම් පාසල් ගුරුවරුන්ගේ අධ්‍යාපන තත්වය නගා සිටුවීම සඳහා දහම් ගුරු සහතික පත්‍ර විභාගය පැවැත්වීම.
- දහම් පාසල් ගුරුවරුන් සඳහා නිලඇදුම් ලබා දීම.
- දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනා ලබා දීම.
- දහම් පාසල් ගුරුවරුන් සඳහා හැඳුනුම්පත් සකස් කිරීම.
- දහම් පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.
- දහම් පාසල් ගොඩනැගිලි සඳහා අධාර ලබා දීම.
- දුෂ්කර දහම් පාසල් සඳහා උපකරණ ලබා දීම.
- අඛණ්ඩව දීර්ඝ කාලයක් සේවයේ යෙදී ඇති දහම් පාසල් ගුරු භවතුන්ගේ සේවාව අගය කර සහතික පත් ප්‍රදානය කිරීම.
- දහම් පාසල් ගුරුවරුන්ගේ පාලි භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා පාලි භාෂා ප්‍රවර්ධන පන්ති පවත්වා විභාගය පැවැත්වීම.
- අඩු අධ්‍යාපන මට්ටමක් සහිත දහම් පාසල් ගුරුවරුන්ට උසස් දහම් අධ්‍යාපනයක් ලබා දීම සඳහා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟත්, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සමඟත් ඒකාබද්ධව දහම් සරසවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

එසේම පාලන අංශය මගින් ආයතනයේ අරමුණු සඵල කර ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කරමින් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සම්බන්ධ පරිපාලන කටයුතු ,ආයතන කටයුතු ,ගොඩනැගිලි නඩත්තුව, තැපෑල සම්බන්ධ රාජකාරි හා වාහන සම්බන්ධ රාජකාරි ඉටුකිරීම ආදිය සිදු කෙරේ.

ආයතනයේ වියහියදම් පාලනය කරමින් වැය ශීර්ෂය වෙත ලබා දෙන මුදල් අදාල කාර්යයන් සඳහා වියදම් කිරීම, ඒ සම්බන්ධ ගණන් පෙන්වීම, වැටුප් ගෙවීම ආදී මූල්‍ය හා ගිණුම් කටයුතු ඉටුකිරීම ගිණුම් අංශය මඟින් සිදුවේ.

ඉහත අංශගත කාර්යයන්ට අමතරව පොදුවේ වාර්ෂිකව පවත්වන ජාතික නිදහස් දින උත්සවය, රාජ්‍ය වෙසක් උත්සවය, වාර්ෂික සිසු නිපුණතා තරඟ පැවැත්වීම, සංඝමිත්තා පෙරහැර හා සංඝමිත්තා ගුණානුස්මරණ උළෙල පැවැත්වීම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් නොකඩවා සිදු කරනු ලබන විශේෂ වැඩසටහන් ලෙස සඳහන් කල හැකිය.

01.2 දැක්ම/ මෙහෙවර/ අරමුණු

දැක්ම

" බොදු පිලිවෙත් සුරකින දැහැමි සමාජයක් "

මෙහෙවර

"සම්බුද්ධ ශාසනයේ විරස්ථිතිය හා ප්‍රවර්ධනය සඳහා වන කාර්යයන් හා කර්තව්‍යයන් මැනවින් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම තුළින්, දැහැමි හා ගුණගරුක සමාජයක් බිහි කිරීම සහ අඛණ්ඩ පැවැත්ම සාක්ෂාත් කිරීම "


අරමුණු

- ථෙරවාදී බුදුදහම ආරක්ෂා කිරීම හා බුද්ධ ශාසනයේ අනනුකූල පැවැත්ම සහතික කිරීම
- සාංඝික දේපළ සුරක්ෂිත කිරීම, සංවිධානය කිරීම හා ඒවා සම්බුද්ධ ශාසනයේ විරස්ථිතිය සඳහාම යෙදවීම
- බෞද්ධ සාරධර්ම අගයන ගුණගරුක නිර්මාණශීලී ජන සමාජයක් ඇති කිරීම
- අනාදිමත් කාලයක සිට බුද්ධ ශාසනය හා බැඳී පැවතෙන වත් පිළිවෙත් හා සම්ප්‍රදායන් ආරක්ෂා කොට අනාගතයට උරුම කර දීම හා කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි පවත්වා ගෙන යාම, පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම
- බෞද්ධ සාහිත්‍ය හා කලා ශිල්ප සංරක්ෂණය කිරීම, පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- සංවිධානාත්මක හා නූතන තාක්ෂණයට අනුකූල බෞද්ධ ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා බෞද්ධ ජනතාව පෙළගැස්වීම හා මෙහෙයවීම

01.3 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්යයන්

- 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ විරස්ථිතිය සඳහාම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහය ලබා දීම හා ශාසනික නියාමන කටයුතු සිදු කිරීම
- විහාරස්ථාන සංවර්ධනය කිරීම
- බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනය පවත්වාගෙන යාම, වැඩිදියුණු කිරීම හා දහම් පාසල් සංවර්ධනය කිරීම
- දිවයිනේ සියලුම සාමණේර / උපසම්පදා භික්ෂූන් වහන්සේලා ලියාපදිංචි කර ලේඛන පවත්වාගෙන යාම
- සාමණේර / උපසම්පදා භික්ෂු පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම
- සිල්මාතාවන් ලියාපදිංචිය, සිල්මාතා අභ්‍යාස ආයතන පවත්වා ගෙන යාම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- විහාරස්ථාන හා සිල්මාතා ආරාම ලියාපදිංචිය සිදු කිරීම
- බෞද්ධ විශ්ව කෝෂ කාර්යාලය හා සංක්ෂිප්ත ත්‍රිපිටක මණ්ඩලය පවත්වාගෙන යාම
- බොදු පිළිවෙතින් ශික්ෂණය ලද සමාජයක පැවැත්ම සහතික කිරීම් වස් සමාජ සංවර්ධන වැඩසටහන්පැවැත්වීම

01.4 සංවිධාන සටහන



01.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ /ප්‍රාදේශීය කාර්යාල

01.5.1 පාලන අංශය

දෙපාර්තමේන්තුවේ පාලන අංශය මඟින් ආයතනයේ පරිපාලනයට අදාලව ඉටු කරනු ලබන අතර ඒවා අතරින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත පරිදි සඳහන් කල හැකිය.

01.5.1.1 පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතු

- දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.
- වැටුප් වර්ධක ලබා දීම.
- නිලධාරීන්ගේ දේපල ණය ලබා දීම සඳහා නිර්දේශ ලබා දීම.
- වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි කිරීම.
- රජයේ නිලධාරීන් සම්බන්ධ රක්ෂණ කටයුතු
- පුහුණු කටයුතු

01.5.1.2 ප්‍රවාහන කටයුතු

- වාහන අලුත්වැඩියාව.
- වාහන සේවා කිරීම.
- රාජකාරි කටයුතු සඳහා වාහන යෙදවීම.
- වාහන රක්ෂණය කිරීම.
- ධාවන සටහන් පොත් පරීක්ෂා කිරීම.
- ඉන්ධන දහනය පරීක්ෂා කිරීම.
- ආදායම් බලපත්‍ර ලබා ගැනීම.
- වාහන සඳහා ඉන්ධන යෙදීම.

01.5.1.3 ආයතනික කටයුතු

- දෙපාර්තමේන්තුව සඳහා නව තනතුරු ඇති කිරීම.
- නිලධාරීන්ගේ පැමිණීම්, පිටවීම් අධීක්ෂණය කිරීම.
- නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ රාජකාරි කටයුතු ඉටු කිරීම.
- දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම
- අතිකාල වලට අදාල වවුචර් භාර ගැනීම හා අනුමත කිරීම.
- ගමන් වියදම් වලට අදාල වවුචර් භාර ගැනීම හා අනුමත කිරීම.
- නිලධාරීන් විසින් ලබා ගන්නා විදේශ නිවාඩු සම්බන්ධ රාජකාරි කටයුතු ඉටු කිරීම.
- නිලධාරීනීන්ගට ප්‍රසූත නිවාඩු ලබා දීමට අදාල රාජකාරි කටයුතු
- සංවර්ධන නිලධාරි තනතුර සඳහා බඳවා ගන්නා ලද නිලධාරීන්ගේ පරිවාස කාලය අවසන් වීමෙන් පසු නිලධාරීන් සේවයේ ස්ථීර කිරීම
- බෞද්ධ විශ්ව කෝෂයේ උප කර්තෘ තනතුර සඳහා උසස් කිරීමේ පටිපාටියක් සකස් කිරීම
- කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.
- පරිගණක යතුරු ලියන සම්බන්ධ රාජකාරි
- රාජකාරි කටයුතු සඳහා විදෙස් රටවලට යන නිලධාරීන්ට විදෙස්ගතව සිටි කාලයට අදාලව දීමනා ලබා දීම.
- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් හා පාඨමාලා සඳහා යොමු කිරීම හා වැඩමුළු පැවැත්වීම.
- ජල, විදුලි, දුරකථන,පුවත්පත් බිල්පත් පියවීම සම්බන්ධ සියළුම රාජකාරි.

- තැපෑල සම්බන්ධ සියළුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ සියළුම පරිපාලන කටයුතු.
- බඳවා ගැනීම, බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීම, කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් යාවත්කාලීන කිරීම, පාර්ලිමේන්තු වාර්තා සැකසීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම ආදී සියළුම ආයතනික කටයුතු.
- නිලධාරීන්ගේ විනය සම්බන්ධ රාජකාරි කටයුතු.
- ආපදා ණය සහ දේපළ ණය අනුමත කිරීම.
- නිලධාරීන්ගේ ස්ථාන මාරු හා අනුයුක්ත කිරීම් සම්බන්ධ සියළුම කටයුතු.
- නිලධාරීන්ගේ අග්‍රහාර රක්ෂණයට අදාළ කටයුතු.
- පරිපාලනයට අදාළව වෙනත් ආයතන සමඟ ගනුදෙනු කිරීම.
- දුරකථන, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම උපකරණ නඩත්තු කිරීම, ගොඩනැඟිලි නඩත්තු සහ අලුත්වැඩියා කිරීම (මහනායක චාරිකාරාමය, මහනුවර ප්‍රාදේශීය කාර්යාලය සහ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය ඇතුළුව).
- මාණ්ඩලික නිලධාරී, ශාඛා ප්‍රධානී රැස්වීම් පැවැත්වීම.
- දිස්ත්‍රික් බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී කළමනාකරණ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාල කටයුතු.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අනෙකුත් සියළුම චක්‍රලේඛ පවත්වා ගෙන යාම හා ඊට අදාළ කටයුතු මෙහෙයවීම.
- මැතිවරණ රාජකාරි සඳහා නිලධාරීන් යොමු කිරීම සම්බන්ධ කටයුතු
- රාජකාරි හැඳුනුම්පත් සකස් කිරීම.
- කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් ලබා දීම.
- යතුරු රාජකාරි පැවරීම.
- කාර්ය මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීම

01.5.2 මාධ්‍ය හා තොරතුරු ඒකකය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මාධ්‍ය හා තොරතුරු ඒකකය ස්ථාපිත කරන ලද්දේ 2015 පෙබරවාරි 14 වන දින වුව ද, පසුගිය වසර 07 පුරාම තොරතුරු අංශය මඟින් දෙපාර්තමේන්තුවට ඉටු විය යුතු සේවය සිදු විය. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මාධ්‍ය හා තොරතුරු අංශයෙහි ප්‍රධාන කාර්යය වන්නේ,

1. දෙපාර්තමේන්තුවේ විවිධ වැඩසටහන් පිළිබඳ මාධ්‍ය ආවරණය හා ප්‍රචාරය ලබාදීම,
2. දෙපාර්තමේන්තුව සතු විවිධ තොරතුරු හා සංඛ්‍යා ලේඛන සකස් කිරීම, ඒකරාශී කිරීම, යාවත්කාලීන කිරීමයි. එම තොරතුරු නිසි පරිදි සකස් කොට රාජ්‍ය හා පුද්ගලික අංශය වෙත මුදාහැරීමත් මෙමඟින් සිදු වේ.

මෙම අංශය මඟින් සිදු කරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

01.5.2.1 තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම හා පුහුණු වැඩසටහන්

බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශයේ ද සහාය ඇතිව තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියක් වර්ෂ 2013 දී ආරම්භ කළ අතර එය මේ වන විට අවසන් අදියරේ පවතී. සකස් කොට ඇති අතර මෙම තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියට (MIS) නිසි අයුරින් තොරතුරු ඇතුළත් කිරීම මත පහත සඳහන් අයුරින් පැහිරී ගිය තොරතුරු විශ්ලේෂණයක් සහිත කාර්යය භාරයක් ඉටුවේ.

තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතිය (MIS)	විහාරස්ථානය අයත් නිකාය පාර්ශ්වය
	වැඩ සිටින ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව
	සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව
	ස්වාමීන් වහන්සේලාගේ අධ්‍යාපන තත්ත්වයන්
	වයස් අනුව ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු
	දසසල් ආරාම තොරතුරු
	දසසිල් මාතාවන් වහන්සේලාගේ තොරුතුරු
	දහම් පාසල
	දහම් පාසල් ගුරු භවතුන්ගේ තොරතුරු
	දහම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තොරතුරු
	විහාරස්ථාන සඳහා මේ වන විට ලබා දී ඇති ආධාර (මධ්‍ය රජයෙන්/ පළාත් සභාවෙන්/ වෙනත්)

ආදී වශයෙන් විවිධ ඒකක යටතේ සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇත. මෙම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමේ කටයුතු ද තොරතුරු අංශය මගින් සිදුකරයි. මෙම තොරතුරු පද්ධතිය යාවත් කාලීන කිරීම සම්බන්ධයෙන් නිරත්නර පුහුණුවක් මාර්ගගත ක්‍රම (online) ඔස්සේ සිදුකරන ලදි.

01.5.2.2දෙපාර්තමේන්තු මුහුණුපොත පිටුව යාවත්කාලීනව පවත්වා ගැනීම
(Facebook/Facebook Page)

දෙපාර්තමේන්තුවෙහි විවිධ වැඩසටහන් හා විශේෂ සිදුවීම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම පිණිස දෛනිකව මෙය යාවත්කාලීන සහිතව සිදුකරයි.

01.5.2.3 යුටියුබ් චැනලය පවත්වා ගැනීම (You Tube – DBA Media)

දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන වැඩසටහන් හා කාලීන වශයෙන් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වැදගත් වන විඩියෝ මෙම චැනලය මගින් විකාශනය කරමින් මහජනතාව දැනුවත් කිරීම සිදුකරයි.

01.5.2.4 මාධ්‍ය කටයුතු

දෙපාර්තමේන්තුවේ විවිධ වැඩසටහන් සඳහා අවශ්‍ය මාධ්‍ය ප්‍රචාරය ලබාදීම, මාධ්‍ය වෙත තොරතුරු සැපයීම, මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම, වැඩසටහන් ඡායාරූපගත කිරීම, එම ඡායාරූප අවශ්‍ය පුද්ගලයන් හා ආයතන වෙත ලබාදීම, එම ඡායාරූප සංරක්ෂණය කිරීම, විවිධ වාර්තා වැඩසටහන් සකස් කිරීම හා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් තුමාගේ සුබ පැතුම් පණිවුඩ නිකුත් කිරීම ද සිදුකරනු ලබයි.

01.5.2.5 දිනපතා පුවත්පත් වාර්තා

දිනපතා පුවත්පත් වලින් අනාවරණය කරන විවිධ වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය කටයුතු සඳහා සහාය දීම, වාර්තා තහවුරු කරගැනීම පිණිස විවිධ පාර්ශවයන් වෙතින් වාර්තා ලබාගැනීම සිදුකරයි.

විශේෂයෙන් බුදු දහමට නිගරු කරන ආකාරයේ වාර්තා හා ඡායාරූප සම්බන්ධයෙන් කටයුතු කිරීමත්, විහාරස්ථාන හා භික්ෂූන් වහන්සේලා වෙත සිදුවන විවිධ චෝදනා, අපහාස, අපකීර්ති හා ශාසනික අර්බුදකාරී වාර්තා සම්බන්ධයෙන් අතිගරු මහානායක ස්වාමීන් වහන්සේලා දැනුවත් කිරීමත් වාර්තා සැපයීමත් සිදුකරයි.

01.5.2.6 මාර්ගගත මෙහෙයුම්

දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරනු ලබන විවිධ රැස්වීම්/ සාකච්ඡා සඳහා මාර්ගගත ක්‍රමයට (online) අදාළව රැස්වීම් සංවිධානය කිරීම (MS office – Team) , විවිධ තොරතුරු මාර්ගගත ක්‍රමයට (online) ගෙන්වා ගැනීම පිණිස (MS Form) කටයුතු සිදුකරයි.

වට්ස් ඇප් සමූහ (Whatsapp) DBA – GOV.lk , DBA.DIS.lk, නිකාය/පාර්ශ්වය ලේඛකාධිකාරී හිමිවරුන්ගේ සමූහ, ශාසනාරක්ෂක මණ්ඩල විධායක සභාව, සඳහා පණිවුඩ හා තොරතුරු නිකුත් කිරීම සිදුකරයි.

විද්‍යුත් තැපෑල (Email) dba.gov.lk@gmail.com වෙත ලැබෙන පණිවුඩ, ඉල්ලීම් හා සේවා කඩිනමින් අදාළ අංශ වෙත යොමු කිරීම හා යාවත් කාලීන කිරීම සිදුකරයි. (පැය 24 ම සක්‍රීය සේවයකි)

01.5.2.7 වෙබ් අඩවිය

දෙපාර්තමේන්තුවෙහි වෙබ් අඩවිය (www.dba.gov.lk) යාවත්කාලීන කිරීම හා එම පද්ධතිය මෙම වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු නියෝජිත තාක්ෂණ ආයතනයේ (LGC) සේවා අවකාසය තුළ ස්ථාපිත කිරීම සිදුකරන ලදි. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් අදාළ තොරතුරු බාගත කිරීමේ හැකියාව ද පවතී.

01.5.3 විහාර දේවාලගම් අංශය

විහාර දේවාලගම් අංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රධාන ධාරාවන් 03ක් යටතේ කාර්යයන් සංවිධාන ගත කර ඇත. එනම්,

(අ) විහාර දේවාලගම් කටයුතු
(ආ) භික්ෂු ලියාපදිංචි කටයුතු
(ඇ) නීති හා අධිකරණ කටයුතු ලෙසටය.

(අ) විහාර දේවාලගම් කටයුතු

- 1931 අංක 19දරණ බෞද්ධ විහාර දේවාලගම් පනතට අනුව පැවරී ඇති සිද්ධස්ථාන දේපළ කළමනාකරණයට අදාල රාජකාරී ඉටු කිරීම.
- සිද්ධස්ථාන භාරකරුවන් පත් කිරීම.
- විහාරාධිපතිධුර පිළිගැනීම.
- විහාරස්ථාන ලියාපදිංචි කිරීම.

(ආ) භික්ෂු ලියාපදිංචි කටයුතු

- නව සාමණේර හා උපසම්පදා ප්‍රකාශපත්‍ර ලියාපදිංචි කිරීම.
- උපැවිදි සහතික නිකුත් කිරීම
- ලියාපදිංචි කරන ලද සාමණේර /උපසම්පදා ප්‍රකාශ පත්‍රවල සහතික පිටපත් නිකුත් කිරීම.
- ලියාපදිංචි කරන ලද සාමණේර /උපසම්පදා ප්‍රකාශ පත්‍රවල අවශ්‍ය සංශෝධන සිදු කිරීම.
- භික්ෂු හැඳුණුම්පත් නිකුත් කිරීම.
- නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත් වීම.

(ඇ) නීති හා අධිකරණ කටයුතු

- දෙපාර්තමේන්තුව, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ නිලධාරියකු පාර්ශවකරුවකු ලෙස නම්කර ඇති අධිකරණ කටයුතු වලදී නීතිපති සභාය ලබා ගැනීම, අවශ්‍ය ලේඛන හා වාර්ථා පිළියෙල කිරීම හා අධිකරණයේ පෙනී සිටීම.
- නඩු ගොනු පවත්වාගෙන යාම.
- නීතිපති උපදෙස් ලබා ගැනීම.
- සිද්ධස්ථාන දේපල අයිතිය පිළිබඳ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- බදු කෙටුම්පත් පරීක්ෂා කිරීම.
- පනත් සංශෝධන ,රෙගුලාසි හා අනෙකුත් නෛතික ලියවිලි සැකසීමට අදාල කටයුතු සිදු කිරීම.

01.5.3.1 විහාරස්ථාන ලියාපදිංචි කිරීම

විහාරස්ථාන ලියාපදිංචි කිරීමේ දී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන විහරාස්ථාන ලියාපදිංචි කිරීමේ අයදුම්පත විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන්වහන්සේ විසින් සම්පූර්ණ කර අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක/සංවර්ධන නිළධාරි විසින් විහාරස්ථානයක් ලෙස ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අයදුම්පතෙහි සංක්ෂිප්ත වාර්තාවක් සමග ඉදිරිපත් කල යුතු අතර අදාළ ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය ද ලබා ගෙන විහාරස්ථානය අයත් නිකායේ මහානායක ස්වාමීන් වහන්සේ වෙතින් විහාරාධිපතිත්වය තහවුරු කිරීමේ ලිපියක් සමග ඉදිරිපත් කල යුතුය.

2008.09.10 දිනට පසුව ආරම්භ කරන ලද විහාරස්ථාන සඳහා බුද්ධශාසන ,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබා ගෙන ඉහත විහාරස්ථානය ලියාපදිංචි කිරීමේ අයදුම්පත සහ විහාරාධිපතිත්වය තහවුරු කිරීමේ ලිපිය සමග ඉදිරිපත් කල යුතුය.අදාළ ලේඛන ඉදිරිපත් කළ පසු බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අත්සනින් යුතු විහාරස්ථාන ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබේ.

01.5.3.2 විහාරාධිපති ධූරයට පිළිගැනීමේ කටයුතු.

විහාරස්ථානයක් ලියාපදිංචි කිරීමෙන් පසු සිදු කරනු ලබන වෙනස් වීමක දී, උදාහරණයක් වශයෙන් පෙර විහාරාධිපති ස්වාමීන්වහන්සේ අපවත් වූ විට , වෙනත් ස්වාමීන්වහන්සේ නමකට විහාරාධිපති ධූරය පැවරීමක් සිදු කර අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේ විසින් සිදු කරනු ලබන විහාරාධිපති පත් කිරීම් වල දී විහාරාධිපති ධූරය පිළිගත් බව දැනුම් දීම සඳහා විහාරාධිපති ලෙස පත් වූ ස්වාමීන් වහන්සේ, ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශිය බෞද්ධ කටයුතු කාර්යාල වලට පිටපත් සහිතව අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේ වෙත ලිපියක් නිකුත් කළ යුතුය.

01.5.3.3 විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) පාලනයේ පවතින විහාරස්ථාන හා දේවාලයන් හි භාරකාර පත්වීම් හා ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ ඇතුළු බස්නායක නිළමේවරුන් පත්කිරීම.

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 7 වෙනි වගන්තිය යටතේ ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේපත් කරනු ලබන අතර ඔහුගේ ධූර කාලය වසර 10ක් වේ.එසේම යථෝක්ත ආඥා පනතේ 8 වගන්තිය අනුව බස්නායක නිළමේ පත් කරනු ලබන අතර ඔහුගේ ධූර කාලය වසර 05 කි.බස්නායක නිළමේවරයෙකුගේ නිළ කාලය අවසන් වූ පසු අතිගරු ජනාධිපතිතුමා වෙත වර්ෂය බැගින් ධූර කාලය දෙවරක් දීර්ඝ කිරීමේ හැකියාව පවතින අතර නිල කාලය අවසන් වූ පසු නිළවරනයක් පවත්වා දියවඩන නිලමේ ,බස්නායක නිළමේ තනතුර සඳහා පුද්ගලයින් තෝරා පත් කර ගනු ලැබේ.

විහාරස්ථානයක භාරකාරවරයෙකු පත් කිරීමේ දී විහාර දේවාලගම් ආඥා පනතේ 10 වගන්තිය යටතේ පත් කිරීම සිදු කරනු ලබන අතර එහිදී විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ භාරකාර ධූරය සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසු වසර 05 ක් සඳහා පත් කිරීම සිදු කරනු ලබන අතර භාරකාර ධූරය සඳහා විහාරාධිපති ස්වාමීන්වහන්සේටද පත්විය හැක.

යථෝක්ත දියවඩන නිළමේ, බස්නායක නිළමේ සහ භාරකාර ධූරය වෙනුවෙන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ මුදලින් ඇප තැන්පත් කළ යුතුය.එහිදී අදාළ සිද්ධස්ථානයේ ආසන්නතම වර්ෂයට අදාළ අර්ධ වාර්ෂික අයවැය වාර්තාවන් හි ආදායම් ශීර්ෂයෙහි එකතුවෙන් 5% ක් ප්‍රමාණයක් ඇප මුදල වශයෙන් තැබිය යුතුය.

01.5.3.4 විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන වල අනුමාන අයවැය හා අර්ධ වාර්ෂික අයවැය ගෙන්වා ගැනීම හා වත්කම් ලේඛන සකස් කිරීම භාරකාර සිද්ධස්ථානවල කටයුතු විගණනය සඳහා යොමු කිරීම.

විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානයන් වෙත දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද අනුමාන අයවැය වාර්තාව ඉදිරි වර්ෂයට අදාළව අදාල සිද්ධස්ථානයේ දියවඩන නිළමේ ,බස්නායක නිළමේ සහ භාරකාර තැන විසින් සකස් කර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුවේ.එසේම මාස 06ට වරක් එම වර්ෂයේ සත්‍ය ආදායම් වියදම් ඇතුලත් කරමින් අර්ධ වාර්ෂික අයවැය වාර්තාවක් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කළ යුතුවේ.

සිද්ධස්ථානයන් හි දේපළ සම්බන්ධ තොරතුරු ඇතුළත් කරමින් දෙපාර්තමේන්තුව මගින් වත්කම් ලේඛන සකස් කරනු ලබන අතර එහි පිටපතක් දෙපාර්තමේන්තුවටද අනික් පිටපත අදාළ සිද්ධස්ථානයේ දියවඩන නිළමේ හා භාරකාරතැන වෙතද භාර දෙනු ලැබේ.එසේ වත්කම් ලේඛන සකස් කිරීම මගින් එම ධූරය සඳහා පත්වන පුද්ගලයින් සඳහා භාණ්ඩ, ලිපිගොනු භාර දීමේදී විනිවිද භාවයෙන් සිදු කළ හැකිවේ.

භාරකාර සිද්ධස්ථානවල විගණන කටයුතු සිදු කිරීම තුළින් අක්‍රමිකතා වලක්වා ගැනීමටත් විනිවිද භාවයකින් සිද්ධස්ථානයේ පරිපාලන හා මූල්‍ය කටයුතු පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් හා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව දැනුවත් කිරීමටත් හැකියාව ලැබේ.

01.5.3.5 විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානයන්හි පඩුරු මුදල් බැංකු ගත කිරීමේ අධීක්ෂණ කටයුතු

විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන ආදායම් ලබන සිද්ධස්ථානයන්හි පඩුරු මුදල් ගණනය කිරීමේ සහ බැංකු ගත කිරීමේ කටයුතු අධික්ෂණය සඳහා දෙපාර්තමේන්තු නිළධාරීන් සහභාගි වේ.එහිදී එම පඩුරු මුදල් ගණනය කිරීම හා බැංකුගත කිරීමේ කටයුතු විධිමත්ව සහ විනිවිද භාවයකින් සිදු කිරීම මෙහි අරමුණ වන අතර එම පඩුරු මුදල් ආදායම් වාර්තාවන්හි එක් පිටපතක් දෙපාර්තමේන්තුවේද ගොනු ගත කරනු ලැබේ.

01.5.3.6 සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීමේ කටයුතු

සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීමේ දී විහාර දේවාලගම් ආඥා පනතේ29 වගන්තිය අනුව බදු දීමේ කටයුතු සිදු කරනු ලබයි.එහිදී බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබාදෙනු ලබන බදු අයදුම්පත සම්පූර්ණ කර බදු දෙනු ලබන ඉඩමේ පිඹුරේ පිටපතක් සහ බදු ගැනුම්කරුගේ හැඳුනුම්පතේහි පිටපතක් සමග දෙපාර්තමේනතුව වෙත ඉදිරිපත් කළ යුතුය.ඒ අනුව බදු ගන්නා කාර්යය අනුව ප්‍රාදේශිය ලේකම් වාර්තාව, තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තාව සහ අනෙකුත් අදාළ අයතනයන්හි වාර්තාවල නිර්දේශ අනුව බදු දීමේ කටයුතු සිදු කරනු ලබයි.එහිදී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අනුමැතියෙන් යුතුව බදු ඔප්පු සකස් කරනු ලබයි.එසේම බ බදු දීමේ දී වර්ෂ 05 කට වරක් ප්‍රදේශයේ පවතින මිල ගණන් අනුව බදු මුදල සංශෝධණය සිදු කිරීම සිදු කරනු ලබයි.

01.5.3.7 බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම.

සිද්ධස්ථානයක පවතින ලියාපදිංචිය, විහාරාධිපති ධූරය, ඉඩම් ආදී සිද්ධස්ථාන සම්බන්ධ ගැටළු පිළිබඳ නඩුකටයුත්තක් අධිකරණයේ විභාග වන අවස්ථාවලදී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙනුවෙන් අදාළ අධිකරණයේ පෙනී සිටීම සිදු කරනු ලබයි.

01.5.3.8 සෙසු කාර්යයන්

I. විහාරාධිපති ධූරය සංශෝධනය කිරීම.
II. අපවත් වූ ස්වාමීන්වහන්සේලා සතු බැංකු මුදල් අදාළ විහාරස්ථානයන්හි සංවර්ධන කටයුතු සඳහා නිදහස් කිරීම.
III. විහාරස්ථාන හා දේවාල සන්තක ඉඩම් වල ගස් කැපීම හා විකිණීමට අනුමැතිය දීම.
IV. පූජා ඔප්පු නිර්දේශ ලබා දීම.
V. අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ වාහන පැවරීමේ කටයුතු
VI. භික්ෂූන් වහන්සේලා විසින් පෞද්ගලිකව මිලදී ගත් දේපල අදාළ ඉල්ලීම මත සඟසතු නොවන බව දැනුම් දීම.
VII. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් වල පවත්වාගෙන යනු ලබන ආරණ්‍ය සේනාසන සඳහා නිර්දේශ ලබා දීම.
VIII. මැණික් පතල් බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීම.
IX. සිද්ධස්ථාන සතු ඉඩම් වෙනුවෙන් හිමි මහා භාරකාර දෙපාර්තමේන්තුවේ තැන්පත් වන්දි මුදල් අදාළ සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් වෙනුවෙන් නිදහස් කිරීමට අදාළ රාජකාරි.
X. මහා භාරකාර දෙපාර්තමේන්තුවේ තැන්පත් විවිධ භාරයන්හී පොලී මුදල් එම සිද්ධස්ථානයේ පරිපාලන කටයුතු සහ සංවර්ධන කාර්යන් වෙනුවෙන් නිදහස් කිරීමට අදාළ කටයුතු.

01.5.3.9 2022 වර්ෂයට අදාල ප්‍රගතිය (සාමන්‍ය පරිපාලන කටයුතු)

අනු අංකය	ඉටු කරනු ලබන රාජකාරි	සංඛ්‍යාව
1	විහාරස්ථාන ලියා පදිංචි කිරීම	183
2	විහාරාධිපති ධුර පත් කිරීමේ ලිපි පිළිගැනීම	337
3	විහාරාධිපති ධුර අවලංගු කිරීම	27
4	විහාරාධිපති ධුර සංශෝධන කිරීම	14
5	විහාරාධිපති ධුර සම්බන්ධයෙන් අති පූජ්‍ය මහා නායක ස්වාමීන් වහන්සේ වෙතින් තහවුරු කිරීම විමසීම්	98
6	නිකාය පාර්ශව සංශෝධන කිරීම	15
7	නව සිද්ධස්ථාන සම්බන්ධයෙන් වාර්තා ලබා ගැනීම	33
8	නව සිද්ධස්ථාන සම්බන්ධයෙන් බු.ශා.අමාත්‍යාංශය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම	21
9	නව සිද්ධස්ථාන සම්බන්ධයෙන් ගැටලු නිරාකරණය කිරීම	25
10	සිද්ධස්ථාන අයිතිය සම්බන්ධයෙන් අධිකරණයේ පෙනී සිට සාක්ෂි ලබාදීම	17
11	පූජාභූමි පිළිබඳ නිර්දේශ ලබාදීම	24
12	පූජා ඔප්පු ලබාදීම සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම	13
13	ආරණ්‍ය සේනාසන සඳහා බලපත්‍ර ලබාදීම	02
14	දේපළ අයිතිය පිළිබඳ ලිපි ලබාදීම	07
15	පදිංචිය පිළිබඳ තහවුරු කර ලිපි ලබාදීම	04
16	සිද්ධස්ථාන සතු දේපළ බදුදීම හා අදාල රාජකාරී (ප්‍රාදේශීය ලේකම් වාර්තා,තක්සේරු වාර්තා ගෙන්වා ගැනීම හා බදු කෙටුම්පත් සකස් කිරීම ඇතුළුව)	114
18	අනුමාන අය වැය වාර්තා ගෙන්වා ගැනීම	53
19	අර්ධ වාර්ෂික අය වැය ලේඛන ගෙන්වා ගැනීම	35
20	අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ ගිණුම් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම්	213
21	අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ වාහන පැවරීම්	28
22	සිද්ධස්ථාන සතු ගස් කැපීමට අනුමැතිය ලබාදීම්	23
23	සිද්ධස්ථානසතු ඉඩම් රජයේ සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීමට අනුමැතිය ලබාදීම	06
24	බස්නායක නිලමේවරුන් පත් කිරීමට අදාළ නිලවරණ පැවැත්වීම්	11
25	ගැටලු නිරාකරණය සඳහා විශේෂ රැස්වීම් පැවැත්වීම්	04
26	විවිධ පාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු සහ චෝදනා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම්	166
28	අති පූජ්‍ය මහා නායක ස්වාමීන් වහන්සේලා වෙතින් උපදෙස් සහ අනුශාසනා ලබා ගැනීම්	72
30	වෙනත් නීතිමය ආයතන වෙත තොරතුරු ලබාදීම්	28
31	පණතට අදාළ තොරතුරු සහ වෙනත් ආයතන වෙතින් ඉල්ලන තොරතුරු ලබාදීම්	123
32	ජනාධිපති කාර්යාලය මගින් යොමු කරනු ලබන ලිපි සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම්	62
33	අග්‍රාමාත්‍ය කාර්යාලය වෙතින් ලැබෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම්	72
34	ඔප්පු ලියා පදිංචි කිරීමට අදාළව ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත නිර්දේශ ලබාදීම්	09

35	විගණන වාර්තා සම්බන්ධයෙන් සිද්ධස්ථාන වෙත හෝ ප්‍රාදේශිය කාර්යාල වෙත උපදෙස් ලබාදීම්	22
36	භාරකාර ඇප මුදල් නිදහස් කිරීම්	01
37	ඇප මුදල් තැන්පත් කිරීම	11
38	ප්‍රාදේශීය කාර්යාල වෙත ලිපි යොමු කිරීම්	695
39	ප්‍රාදේශිය ලේකම් වාර්තා ගෙන්වාගැනීම	129
40	විවිධ ලිපි	211
41	නිදහස් කරන ලද වන්දි මුදල්වල මුළු ශේෂය කිරීම	රු.58,545245.00
42	නිදහස් කරන ලද විහාර ගිණුම් වල මුළු ශේෂය	රු.38,426496.00

01.5.3.10 ඉදිරි ඉලක්ක

(අ) සිද්ධස්ථාන දේපල කළමණාකරනය

<u>ඉඩම්</u>

- සිද්ධස්ථාන සතු ඉඩම් හඳුනාගැනීම
- ඉඩම් මැනීම් කටයුතු සිදුකර සිද්ධස්ථාන අයිතිය තහවුරු කරන ලේඛන සකසා ගැනීමට සහාය වීම
- නීත්‍යානුකූල නොවන ආකාරයට හක්ති විදින ඉඩම් නීත්‍යානුකූල බදු ලබා දීම සිදු කිරීම
- රාජකාරී ලේඛන යාවත්කාලීන කිරීම
- සිද්ධස්ථාන සතු භාවිතයට නොගත් හා ඵලදායිව භාවිතා නොකරන ඉඩම් කොටස් ඵලදායි කාර්යය සඳහා යෙදවීම.

<u>වත්කම්</u>

- සිද්ධස්ථාන සතු වත්කම් ලේඛනගත කිරීම

(ආ) විහාර දේවාලගම් පනතට අදාළව රෙගුලාසි සැකසීම

- සිද්ධස්ථාන විසින් පවත්වාගෙන යා යුතු හා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු ලේඛන යාවත්කාලීන කිරීමට අදාල රෙගුලාසි.
- සිද්ධස්ථාන පනතේ 4- 1 වගන්තියට යටත් කිරීමට අදාලව නිර්නායක සකස් කිරීම පිළිබඳ රෙගුලාසි
- බස්නායක නිළමේවරු තොරා ගැනීමේදී අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග පිළිබඳ රෙගුලාසි
- සිද්ධස්ථාන දේපල බදු ලබා දීමේදී බදු මුදල් තීරණය කිරීමට අදාළව රෙගුලාසි
- සිද්ධස්ථාන වලට පවත්වාගෙන යා යුතු නිත්‍ය කාර්යය මණ්ඩල හා ඔවුන්ගේ සුදුසුකම් වැටුප් පරිමාන පිළිබඳ රෙගුලාසි

(ඇ) දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩසටහන්

විහාරාධිපති ස්වාමීන් වහන්සේලා, සිද්ධස්ථාන භාරකරුවන්, රාජකාරිකරුවන් හා නීතීඥයන් විහාර දේවාලගම් ආඥා පනතට අදාල කාර්යන් සම්බන්ධයෙන් දැනුවත් කිරීම.

(ඈ) නීතිමය කටයුතු සඳහා වත්කම් නොමැති සිද්ධස්ථාන සඳහා නීති ආධාර කොමිෂන් සභාව හරහා අවශ්‍ය සහාය ලබා ගැනීම.

(ඉ) භික්ෂු ලියාපදිංචි දත්ත පද්ධතිය හා කළමණාකරන දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම.

01.5.4 භික්ෂු ලියාපදිංචි අංශය

1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 41 වන වගන්තිය අනුව සාමණේර උපසම්පදා ස්වාමීන් වහන්සේලා ලියාපදිංචි කටයුතු සිදුකර එම ලේඛන පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

01.5.4.1 2022-01-01 සිට 2022-12-31 දින දක්වා ප්‍රධාන කාර්යයන්ට අදාළ කාර්ය සාධන වාර්ථාව

* ලියාපදිංචි කරන ලද සාමණේර ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව	-3286
* ලියාපදිංචි කරන ලද උපසම්පදා ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව	-1831
* ලියාපදිංචි කරන ලද සහතික වල සිදු කරන ලද සංශෝධන සංඛ්‍යාව	-476
* නිකුත් කරන ලද සාමණේර, උපසම්පදා සහතික පිටපත් සංඛ්‍යාව	-19536
* නිකුත් කරන ලද උපැවිදි සහතික සංඛ්‍යාව	-1890
* නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත් සංඛ්‍යාව	-154

01.5.4.2 සාමණේර හා උපසම්පදා ලේඛණ හා තොරතුරු පරිඝණක ගත කිරීම.

1931අංක 19 බෞද්ධ විහාර දේවාලගම් පනතට අනුව පැවිදි දිවියට ඇතුළත් වන සහ උපසම්පදාව ලබන සියළු භික්ෂූන් වහන්සේලා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය.එම ආඥා පනත බලාත්මක වූ දා පටන් මේ දක්වා (2022-12-31) දින වන විට සාමණේර ලේඛණ 116286 ක් හා උපසම්පදා ලේඛණ 59685 ක් ලියාපදිංචි කර ඇත.

එම පනතට අනුව යම් අවශ්‍යතාවයක් මත එකී ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉල්ලූ විට නියමිත ගාස්තු අය කර ගැනීමෙන් පසු ලබා දීම බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වරයා සතු වගකීමකි.විශාල පිරිසක් දෛනිකව තම සහතික පත්‍රයෙහි පිටපත් ඉල්ලා පැමිණෙන අතර ඔවුන් තම සහතිකයේ ලියාපදිංචි අංකය නොදැනීම නිසා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් විධිමත් ලෙස යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබන සාමණේර හා උපසම්පදා රෙජිස්ටරයෙන් ලියාපදිංචි අංකය සොයා ගැනීමට සිදුවේ. මෙය ඉතා වෙහෙසකර හා විශාල කාලයක් ගත වන කටයුත්තක් බැවින් එය ඉතා පහසුවෙන් සිදු කර ගත හැකි වන පරිදි නවීන තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් මෙම සියළු ලේඛණ හා තොරතුරු පරිඝණක ගත කිරීම සඳහා පරිඝණක මෘදුකාංගයක් නිර්මාණය කර දත්ත පද්ධතියක් සකස් කර ඇත. එම දත්ත පද්ධතියට 2022-12-31 දිනට උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු හා ලේඛණ 46204 ක්ද, සාමණේර ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු හා ලේඛණ79267 ක්ද ඇතුලත් කර ඇත.

එසේම මෙම මෘදුකාංගය භාවිත කරමින් මේ වන විට දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල වන රත්නපුර, මහනුවර , කුරුණෑගල යන කාර්යාල මගින් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සාමණේර හා උපසම්පදා සහතික පිටපත් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. එමගින් දුෂ්කර පළාත් වල සිට බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට පැමිණ ඉටු කර ගත යුතුව තිබූ කටයුත්තක් තමාට පහසු ප්‍රදේශයකින් කර ගැනීමේ හැකියාව ලැබී ඇත.

01.5.4.3 නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ ආකල්ප සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්

සම්බුදු සසුනේ විරස්තිථිය හා අභිවෘද්ධිය වෙනුවෙන් නවක සාමණේර සහ උපසම්පන්න භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය කරන්නා වූ දැනුම අවබෝධය සහ හික්මීම කුඩා කල සිටම ලබා දීම අරමුණු කරගනිමින් බුද්ධශාසන අමාත්‍යාංශය සහ බෞද්ධ කටුයතු දෙපාර්තමේන්තුව එක්ව ලංකාවේ වැඩසිටින නවක සාමණේර හා උපසම්පන්න භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලාගේ හා විද්වත් ස්වාමීන් වහන්සේලාගේ අනුශාසන පරිදි දිස්ත්‍රික් මට්ටමින් පුහුණු කිරීමේ වැඩ සටහනක් 2017 වර්ෂයේදී ආරම්භ කරන ලදි. මෙහිදි පහත සඳහන් අරමුණු ද සාක්ෂාත් කර ගැනීම පිණිස මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- දැනට ලංකාවේ වැඩ වාසය කරන නවක සාමණේර ස්වාමීන් වහන්සේලාගේ ඇවතුම් පැවතුම්, ආගමික වත්පිළිවෙත් හා පැවිදි දිවිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය මූලික දැනුම ලබා දීම හා ප්‍රායෝගික පුහුණුව ලබා දීම.

- සාමණේර ස්වාමීන් වහන්සේලාට ආගමික කටයුතු ඉටු කිරීම පිළිබඳව පුහුණුවක් ලබා දීම හා ස්වාමීන් වහන්සේලාගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීම

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සාමණේර ස්වාමීන් වහන්සේලාගේ

- පෞරුෂ සංවර්ධනය(ඉදිරිපත්වීම,අභියෝග භාර ගැනීම,දරා ගැනීමේ ශක්තිය හා ඉවසීම ඇති කිරීම,සබකෝලය මග හැර ගැනීම)
- හැකියාවන් හා කුසලතා හඳුනා ගැනීම
- සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ඇති කිරීම
- ශාසනික වත් පිළිවෙත් හුරු කරවීම
- අන් අයට හා අන් මතයන්ට ගරු කිරීම
- ත්‍රිපිටකාශ්‍රිත මූලික දැනුම වර්ධනය කිරීම
- පාලි සංස්කෘත ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ මූලික අවබෝධය
- දේශනා ගායනා සහ සජ්ඣායනා පිළිබඳ කුසලතා වර්ධනය
- භාවනාව පිළිබඳ මූලික අවබෝධය


  යන කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මෙම පුහුණු වැඩ සටහන පවත්වනු ලබයි.


මෙම වැඩ සටහන නේවාසික පුහුණුවක් ලෙසින් පැවැත්වේ. දෛනික කාල සටහනකට අනුව විද්වත් ස්වාමීන් වහන්සේලා විසින් පවත්වනු ලබන දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් පුහුණුව ලබා දීම සිදු කරනු ලබයි.


2022 වර්ෂයේදී සාමණේර ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පුහුණු වැඩ සටහන් 05ක් හා උපසම්පදා ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් වැඩසටහන් 03ක් ලෙස වැඩ සටහන් 08ක් පන්නිපිටිය දෙවුරම් මහා විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබුණද රටේ පවතින තත්වය මත උපසම්පදා ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් වැඩ සටහන් 04 පමණක් පවත්වන ලදී. එම වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.


01.5.4.4 2022-01-01 සිට 2022-12-31 දින දක්වා නවක උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ ආකල්ප සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු (ප්‍රගතිය)

වැඩ සටහන පැවැත්වූ දින	වැඩ සටහන පැවැත්වූ ස්ථානය	වැඩ සටහන සහභාගිවූ සංඛ්‍යාව	වියදම(රු)
2022-02-05දින සිට 2022-02-13 දක්වා	පන්නිපිටිය දෙවිරම් මහා විහාරය	40	රු.154875.00
2022-03-20දින සිට 2022-03-27 දින දක්වා	පන්නිපිටිය දෙවිරම් මහා විහාරය.	41	රු.158500.00
2022-06-18 දින සිට 2022-06-24 දක්වා	පන්නිපිටිය දෙවිරම් මහා විහාරය	64	රු.191000.00
2022-12-11 දින සිට 2022-12-18 දින දක්වා	පන්නිපිටිය දෙවිරම් මහා විහාරය.	70	රු.230000.00


2000
1800
1600
1400
1200
1000
800
600
400
200
0
වර්ෂය 2018
වර්ෂය 2019
වර්ෂය 2020
වර්ෂය 2021
වර්ෂය 2022
උපසම්පදා ලියාපදිංචිය


2000
1800
1600
1400
1200
1000
800
600
400
200
0
වර්ෂය 2018
වර්ෂය 2019
වර්ෂය 2020
වර්ෂය 2021
වර්ෂය 2022
උපැවිදි සහතික නිකුත් කිරීම


4000
3500
3000
2500
2000
1500
1000
500
0
වර්ෂය 2018
වර්ෂය 2019
වර්ෂය 2020
වර්ෂය 2021
වර්ෂය 2022
සාමණේර ලියාපදිංචි කිරීම.


2000
1800
1600
1400
1200
1000
800
600
400
200
0
වර්ෂය 2018
වර්ෂය 2019
වර්ෂය 2020
වර්ෂය 2021
වර්ෂය 2022
භික්ෂු හැදුනුම්පත් සකස් කිරීම

01.5.4.5 ඉදිරි ඉලක්ක

- විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා එක්ව පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සාමණේර උපසම්පදා භික්ෂූන් පිළිබඳ දත්ත පද්ධතියට මේ වන විට ලියාපදිංචි කර ඇති සියළුම සාමණේර හා උපසම්පදා සහතික ඇතුලත් කිරීම.

01.5.5 නීති අංශය

01.5.5.1 නඩු ගොනුවල ප්‍රගතිය

කාරණය	නඩුගොනුආරම්භ කිරීම										
	2014.08.15 ට පෙර	2014.08.15 සිට	2015	2016	2017	2018	2019	2020	2021	2022	එකතුව
2022.12.30 දින වන විට විභාග වන නඩු ගණන	40	5	8	8	8	16	27	16	16	15	**159**
2022.12.30දින වන විට අවසන් වී ඇති නඩු ගණන	54	1	12	8	11	14	8	2	8	**3**	**121**
එකතුව	**94**	**6**	**20**	**16**	**19**	**30**	**35**	**18**	**24**	**18**	**280**

නඩු ගොනුවල ප්‍රගතිය එක් වර්ෂයකට අදාළව පමණක් දැක්විය නොහැකි අතර 2006 වර්ෂයේ සිට මේ දක්වා ගරු බුද්ධශාසන අමාත්‍යතුමා, බුද්ධශාසන අමාත්‍යාංශ ලේකම්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්, කොමසාරිස්, නියෝජ්‍ය කොමසාරිස් හා සහකාර කොමසාරිස් ඇතුළු බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට විරුද්ධව විත්තිකරුවන් හෝ වගඋත්තරකරුවන් ලෙස නම්කරමින් ගොනු කර තිබෙන නඩුවලට අදාලව, අදාල විෂය ගොනු පරිශීලනය කර බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙනුවෙන් නීති අංශය මගින් නිරීක්ෂණ ලබා දී ඇත. එම නිරීක්ෂණ පාදක කරගෙන ගරු නීතිපති විසින් කරුණු ඉදිරිපත් කිරීම මත ඉහත සඳහන් කර තිබෙන නඩු 280 න් 121 ක්ම වගඋත්තරකරු හෝ විත්තිකරු වන පාර්ශ්වයන් නිදහස් කිරීම, මුදා හැරීම හෝ සමථයකට පත්කිරීම මත අවසන් වී ඇති අතර බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට විරුද්ධව තීන්දු ලබාදීමේ අවදානම නිරීක්ෂණ මගින් නිවැරදි කරුණු අධිකරණයට ඉදිරිපත් කිරීම තුළින් අවම කර ඇත. මෙම නඩු අවසන් වී තිබුණ ද එම නඩු තීන්දුවලට විරුද්ධව ඉහළ අධිකරණවල අභියාචනා කිරීම මත එම නඩු ගොනු නැවත යාවත්කාලීන කිරීමට ද සිදුවී ඇත.

01.5.5.2 නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නඩුවල කටයුතු සිදු කිරීම

අනු අංකය	කාර්යය
1	නඩු වලට අදාළව ගොනු ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම
2	නඩු වලට අදාළව විෂය ගොනු එක්රැස් කිරීම
3	අදාළ ලේඛන රැස් කිරීම
4	ලේඛන ඡායාපිටපත් කිරීම
5	පෙරකලාසිගොනු කිරීම
6	දිවිරුම් ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම
7	විෂය ගොනු අධ්‍යයනය කොට නඩු නිරීක්ෂණ සකස් කර ඉදිරිපත් කිරීම
8	සාක්ෂි ලැයිස්තු සකස් කිරීම
9	නඩු සඳහා අවශ්‍ය වන අවස්ථා වලදී අධිකරණයේ පෙනී සිටීම
10	නඩු වලට අදාළ විභාග සටහන් සහ කාර්ය සටහන් පිටපත් ලබා ගැනීම
11	නීතිපති දෙපාර්තමේන්තුව දැනුම් දෙන අවස්ථාවල දී අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීම
12	නීති උපදේශනය සඳහා සහභාගි වීම

01.5.5.3 බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සහ ප්‍රාදේශීය කාර්යාලවලින් යොමු කරන ගොනු සඳහා නිරීක්ෂණ ලබාදීම හා වෙනත් කාර්යයන්හි ප්‍රගතිය

අනු අංකය	කාර්යය	ඉදිරිපත් වී ඇති සංඛ්‍යාව	නිරීක්ෂණ/ පිළිතුරු ලබාදුන් සංඛ්‍යාව	ප්‍රගතිය (%)
1	දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවලින් යොමුකරන ගොනු සඳහා නිරීක්ෂණ ලබා දීම	114	103	90.3
1.1	සිද්ධස්ථාන සතු දේපළ අයිතිය පිළිබඳ නිරීක්ෂණ	45	41	91.1
1.2	බදු කෙටුම්පත් පරීක්ෂාව	38	32	84.2
1.3	වෙනත්	31	29	93.5
2	ප්‍රාදේශීය කාර්යාලවලින් යොමුකරන ගොනු සඳහා නිරීක්ෂණ ලබාදීම	12	12	100.0
3	පනත් සම්බන්ධ නිරීක්ෂණ ලබාදීම			100.0
4	ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම			100.0
5	නඩු ගොනු පවත්වාගෙන යාම			100.0

01.5.6 සංවර්ධන අංශය

01.5.6.1 සංවර්ධන හා ප්‍රගති අංශයේ කාර්යය භාර්යය

(අ) ජාතික හා ආගමික උත්සව සම්බන්ධීකරණය

- රාජ්‍ය වෙසක් උත්සවය සඳහා දායකත්වය ලබාදීම
- රාජ්‍ය පොසොන් උත්සවය සඳහා දායකත්වය ලබාදීම
- රාජ්‍ය කඨින මහෝත්සවය
- ජාතික නිදහස් උත්සවය වෙනුවෙන් පිරිත් දේශනාව හා නිදහස් දින ආගමික වැඩසටහන් පැවැත්වීම
- ආදාහන කටයුතු සඳහා ආධාර ලබාදීම
- උපසම්පදා උත්සවයන්හි දී උපසම්පදා අපේක්ෂක ස්වාමීන් වහන්සේලා වෙත ගමන් වියදම් දීමනා ගෙවීම
- සංඝමිත්තා ගුණ සමරු උළෙල සංවිධානය කිරීම
- මහානායක ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පැවැත්වෙන විශේෂ උත්සව සංවිධාන කටයුතු සඳහා සහයෝගය ලබාදීම

(ආ) ශාසනික සංවිධාන කටයුතු

- සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු සංවිධානය සඳහා සහාය වීම හා පහසුකම් සැලසීම
- ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල සම්බන්ධීකරණය කිරීම
- දිස්ත්‍රික් සිල්මාතා හා ජාතික මණ්ඩල රැස්වීම් සම්බන්ධීකරණය , සංවිධානය සඳහා සහායවීම හා පහසුකම් සැලසීම
- සංක්ෂිප්ත ත්‍රිපිටක මණ්ඩල සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම
- ශ්‍රී මහා බෝධි සංවර්ධන අරමුදල හා රන්වැට සංරක්ෂණය අරමුදල සම්බන්ධීකරණය කිරීම
- බෞද්ධ විශ්වකෝශයේ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- නිකාය /පාර්ශ්ව මූලස්ථානවලට පහසුකම් ලබාදීම

(ඇ) ශාසනික සංවර්ධන කටයුතු

- සිල් මැනියන් වහන්සේලා ලියාපදිංචි කිරීම හා උපැවිදි සහතික නිකුත් කිරීම
- සිල්මාතා හැඳුනුම්පත් සකස් කිරීම.
- සිල්මාතා ආරාම ලියාපදිංචි කිරීම
- විහාරස්ථාන හා සිල්මාතා ආරාම දායක සභා ලියාපදිංචි කිරීම
- කාර්ය සාධක සමිති ලියාපදිංචිය සඳහා නිර්දේශ ලබාදීම
- විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල ලියාපදිංචි කිරීම
- දුෂ්කර විහාරස්ථාන වෙත සිවිපස ආධාර ලබාදීම
- අටපිරිකර නිෂ්පාදනය සම්බන්ධව ප්‍රමිතිය සකස් කිරීම හා අලෙවි සැල් ලියාපදිංචි කිරීමට පියවර ගැනීම
- යෝජිත බෞද්ධ විශ්වකෝෂය පරිගණක ගතකර අන්තර්ජාලයට එක් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

(ඈ) යටිතල පහසුකම් සංවර්ධන කටයුතු

- ඌණ සංවර්ධිත දහම් පාසල් සඳහා පහසුකම් සැලසීම (දහම් පාසල් ගොඩනැගිලි හා උපකරණ ද්‍රව්‍ය ලබාදීම)
- මිහිදු සෙවන ව්‍යාපෘතිය සඳහා නිර්දේශ ලබාදීම
- ශාසනාරක්ෂක මණ්ඩල සඳහා උපකරණ ලබාදීම
- සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනවල භෞතික සංවර්ධන කටයුතු සිදුකිරීම
- ලේඛකාධාර යටතේ පොත් මිලදී ගැනීම.

(ඉ) පුහුණු වැඩසටහන්

- නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලා සඳහා ‘‘කුසලස්ස උපසම්පදා’’ නමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- විහාරාධිපති ස්වාමීන් වහන්සේලා සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රාදේශිය ශාසනාරක්ෂක මණ්ඩල ගරු සභාපති , ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- මුලටියන පියදාස රත්නායක අනුස්මරණ සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- අනුරාධපුර සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- කැළණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ‘‘අංජලිකරණී ’’ නමින් දීප ව්‍යාප්තව සිල්මාතා පුහුණු වැඩසටහන් පැවැත්වීම

01.5.6.2 රාජ්‍ය වෙසක් උත්සවය සඳහා දායකත්වය ලබාදීම

2020, 2021 වසර වල රට පුරා පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත රාජ්‍ය වෙසක් උත්සවයේ කටයුතු සැලසුම් කල පරිදි ජන සහභාගිත්වයකින් යුතුව පැවැත්වීමට නොහැකි විය. කෙසේ වෙතත් 2022 වර්ෂයේ දී ඓතිහාසික බලංගොඩ කූරගල රාජමහා විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් වෙසක් පොහෝ දින වැඩසටහන් පවත්වන ලදී.





01.5.6.3 පොසොන් උත්සවය රාජ්‍ය අනුග්‍රහය යටතේ පැවැත්වීම

වාර්ෂික රාජ්‍ය පොසොන් උත්සවය මිහින්තලා රාජ මහා විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් පැවැත් වේ. 2022 වර්ෂයේ පොසොන් රාජ්‍ය උත්සවය අති පූජනීය මහානායක , අනුනායක ස්වාමීන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දීමට හැකියාව ලැබිණි.





01.5.6.4 නිදහස් උත්සවය නිමිත්තෙන් පවත්වන පරිත්‍රාණ ධර්ම දේශනාව හා ආගමික වතාවත්

ජාතික නිදහස් දිනය නිමිත්තෙන් රටට සහ ජනතාවට සෙත් පතා නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේ දී සෑම වසරකම පෙබරවාරි 02 වන දින රාත්‍රී පිරිත් පිංකම සහ පසුදින සංඝගත දක්ෂිණාව පැවැත්වේ. ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලාගේ උපදෙස් පරිදි වසරක් පාසා නිකායත්‍රය මාරු වෙමින් මෙහි සංවිධාන කටයුතු සිදු කරනු ලැබේ.2022 වර්ෂයේද අවම ජන සහභාගිත්වයකින් පරිත්‍රාණ ධර්ම දේශනය පවත්වන ලදී.

ජාතික නිදහස් දින පෙරවරුවේ සිදු කරනු ලබන සර්වාගමික වතාවත් අතුරින් බෞද්ධාගමික වතාවත් එක් විහාරස්ථානයක් කේන්ද්‍ර කර ගෙන සංවිධානය කරනු ලබයි.ඒ අනුව 2022 වර්ෂයේ නිදහස් දින ආගමික වතාවත් පෙබරවාරි 04 වන දින උදෑසන නාරාහේන්පිට අභයාරාමයේදී පවත්වන ලදී.

74 වන ජාතික නිදහස් උත්සවයට සමගාමීව කොළඹ 07 නිදහස් මන්දිරයේ පැවැති පිරිත් පිංකම සහ නාරාහේන්පිට අභයාරාමයේ ,හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ ආගමික වතාවත් පැවැත්වීම වෙනුවෙන් රුපියල් මිලියන 1.2 වැය කරන ලදී.








01.5.6.5 ආදාහන පූජෝත්සව

අපවත් වී වදාළ මහානායක ස්වාමීන් වහන්සේලාගේ ආදාහන උත්සව පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව ද ප්‍රධාන පෙළේ නායක ස්වාමීන් වහන්සේලා සඳහා රාජ්‍ය අනුග්‍රහ සහිතවද ප්‍රාදේශීය භික්ෂූන් වහන්සේලා සඳහා ප්‍රතිපාදන ලබා දීමෙන් ද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ආදාහන පූජෝත්සව සිදු කෙරේ. 2022.01.01 සිට 2022.12.31 දක්වා ලබා දී ඇති ප්‍රතිපාදන මෙසේය.

අනු අංකය	මාසය	අපවත් වූ ස්වාමීන් වහනසේලා සංඛ්‍යාව	ලබා දී ඇති මුළු ප්‍රතිපාදන
01	ජනවාරී	26	252,500.00
02	පෙබරවාරී	20	757,500.00
03	මාර්තු	27	240,000.00
04	අප්‍රේල්	29	285,500.00
05	මැයි	26	280,000.00
06	ජුනි	18	215,000.00
07	ජූලි	18	170,000.00
08	අගෝස්තු	42	390,000.00
09	සැප්තැම්බර්	18	192,500.00
10	ඔක්තෝම්බර්	32	307,500.00
11	නොවැම්බර්	24	247,500.00
12	දෙසැම්බර්	40	257,500.00
	එකතුව	3,595,500.00	






01.5.6.6 උපසම්පදා උත්සව

ශාසනයේ තිර පැවැත්ම සඳහා සුපේශල ශික්ෂාකාමී ස්වාමීන් වහන්සේලා සිටීම අත්‍යවශ්‍ය කරුණකි.මේ යටතේ සියලුම නිකාය පාර්ශව සංවිධානත්වයෙන් පැවැත්වෙන නවක උපසම්පදා උත්සව වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය ලබාදීම යටතේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් රුපියල් 3000 බැගින් සියලුම නවක උපසම්පදාලාභී ස්වාමීන් වහන්සේලා සඳහා ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ලැබේ.මේ යටතේ 2022 වර්ෂයේ ලබා දුන් ප්‍රතිපාදන පහත පරිදි වේ

අනු අංකය	නිකාය පාර්ශ්වය	උපසම්පදාලාභී ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව	වෙන් කළ ප්‍රතිපාදන (රු.)
01	සියාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු පාර්ශ්ව	400	1,200,000.00
02	අමරපුර මහා නිකායේ රාස්සගල පාර්ශ්වයේ උපසම්පදාව	10	30,000.00
03	ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය	379	1,137,000.00
04	සියාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාව	30	90,000.00
එකතුව		**819**	**2,457,000.00**



01.5.6.7 ජය පිරිත් සජ්ඣායනය -2022

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව " **සෞභාග්‍යමත් නව වසරක් සඳහා ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය"** තේමාවට අනුකූලව ජය පිරිත් සජ්ඣායනා පිංකම 2022 ජනවාරි මස 26 වන දින බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේ දී ගරුතර මහා සංඝයා වහන්සේලා දහස් නමකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

එම ජය පිරිත් දේශනය සඳහා වැඩම කරන ලද ස්වාමීන් වහන්සේලාට අවශ්‍ය ගමන් වියදම් හා ප්‍රත්‍ය පහසුකම් සලසා ගැනීම වෙනුවෙන් රුපියල් 591,475.00 වැය කරන ලදී



01.5.6.8 මහානායක ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පැවැත්වෙන විශේෂ උත්සව අක්තපත්‍ර ප්‍රදානෝත්සව

ශ්‍රී ලංකා අමරපුර මහ නිකායේ සිව් වැනි උත්තරීතර මහානායක , අමරපුර ශ්‍රී කල්‍යාණිවංශ මහා නිකායේ මහානායක, අමරපුර ගණපාමොක්ඛාචරිය,කල්‍යාණිවංශ කීර්ති ශ්‍රී වංගීස වංසාලංකාර විපස්සනා කම්මට්ඨානාචරිය,අග්ගමහාපණ්ඩිත ,අතිපූජ්‍ය දොම්පහල චන්ද්‍රසිරි ස්වාමීන් වහන්සේට අභිනව ධුරය පිළිබඳ අක්තපත්‍ර ප්‍රදානය උත්සවය 2022.01.14 වන දින බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පවත්වන ලදී.

ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ 14 වන මහා නායක පදවියට පත් වූ අතිපූජ්‍ය අග්ගමහාපණ්ඩිත මකුලෑවේ ශ්‍රී විමල ස්වාමීන් වහන්සේට අක්තපත්‍ර ප්‍රදානය 2022.05.07 වන දින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහභාගීත්වයෙන් කොළඹ 07 නිදහස් චතුරස්‍රයේ දී පවත්වන ලදී.







01.5.6.9 ශාසනික සංවිධාන කටයුතු

බුදු සසුනේ උන්නතිය චිරස්ථිතිය දිවයින පුරා තිබෙන බෞද්ධ ශාසනික සංවිධාන ශක්තිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබා දීම සිදු කරනු ලැබේ.ශක්තිමත් බෞද්ධ නායකත්වයක් තුළින් අධ්‍යාත්මික පිරිපුන් සමාජයක් බිහි කිරීම මෙහි අරමුණයි.

01.5.6.9.1 ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රියාත්මක කිරීම

බුද්ධ ශාසනයේ සුබසිද්ධිය ප්‍රවර්ධනය කිරීම සඳහාත් භික්ෂු සමාජයේ සංවර්ධනය සඳහාත් 2014 අංක 16 දරණ සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ සංස්ථාපනය කර ඇති සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා වන පහසුකම් සැපයීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.මේ යටතේ සමස්ත ලංකා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල නිලවරණ පැවැත්වීම විධායක සභා රැස්වීම පැවැත්වීම සහ දිවයින පුරා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා සඳහා ලිපිද්‍රව්‍ය හා ගමන් වියදම් ගෙවීම සිදු කරනු ලැබේ. 2022 වර්ෂය සඳහා පහත පරිදි වියදම් දරා ඇත

රැස්වීම	වියදම් වූ මුදල (රු.)
සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල මහා සභා රැස්වීම් හා විධායක සභාව රැස්වීම් (ගමන් වියදම් හා ප්‍රත්‍යා පහසුකම් සඳහා)	561,860.00
ප්‍රා.ශා.ම. ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලාට ලිපි ද්‍රව්‍ය , තැපැල් හා ගමන් වියදම් 15000X 326	4,890,000.00
දිස්ත්‍රික් ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලාට ලිපි ද්‍රව්‍ය , තැපැල් හා ගමන් වියදම් 7500X 24	180,000.00
සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේට ලිපි ද්‍රව්‍ය , තැපැල් හා ගමන් වියදම්	25,000.00
මුළු වියදම	**5,656,860.00**

මීට අමතරව ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු පහසු කරගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් වෙනුවෙන් පරිගණක ඇතුළු කාර්යාලීය උපකරණ ලබා දීමද දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ සිදු කරනු ලැබේ. 2022 වර්ෂයේ ලබා දුන් ප්‍රතිපාදන විස්තර පහත දැක් වේ.

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	මුදල
රත්නපුර	කල්තොට	210,450.00

01.5.6.9.2 සිල්මාතා මණ්ඩල ක්‍රියාත්මක කිරීම

2002 වර්ෂය බුද්ධශාසන ජනාධිපති කොමිෂන් වාර්තාව අනුව සිල්මාතා ලියාපදිංචි කිරීම් කටයුතු සිදු කරනු ලබන අතර මේ යටතේ ජාතික, දිස්ත්‍රික් ප්‍රාදේශීය මට්ටමෙන් සිල්මාතා මණ්ඩල ක්‍රියාත්මක කරනු ලබයි. මෙම සිල්මාතා මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා 2022 වර්ෂයේ සමස්ත ලංකා ජාතික මණ්ඩල රැස්වීම් 02 ක් හා දිස්ත්‍රික් සිල්මාතා මණ්ඩල රැස්වීම් 02 ක් පවත්වන ලදී. ඒ අනුව සිල්මාතා මණ්ඩල ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2022 වසරේ වියදම් කරන ලද මුදල රුපියල් 849,500.00 ක් වේ.



01.5.6.9.3 නිකාය මූලස්ථාන කාර්යාල පවත්වාගෙන යාම

නිකාය මූලස්ථාන කාර්යාල පවත්වාගෙන යාම සඳහා ඒ ඒ නිකාය යටතේ පාලනය වන විහාරස්ථාන ප්‍රමාණය සැලකිල්ලට ගෙන කාර්යාල සඳහා දීමනාවක් ලබාදීම සිදු කරනු ලැබේ.මේ යටතේ කාර්යාල සේවකයන් හා රියදුරු දීමනාවක් ලෙස මසකට රු.20,000.00 බැගින් වසරකට 240,000.00ක් අවස්ථා 2 කදී ලැබෙන පරිදි ලබාදීම සිදු කෙරේ. 2022 පහත පරිදි වියදම් දරා ඇත.

නිකාය පාර්ශ්වය	ලබා දුන් මුදල
සියම් නිකායේ මල්වතු පාර්ශ්වය	240,000.00
අස්ගිරි පාර්ශ්වය	240,000.00
ශ්‍රී ලංකා අමරපුර මහා නිකාය	240,000.00
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය	240,000.00
ශ්‍රී ලංකා කෝට්ටේ කළ්‍යාණි සාමග්‍රී සංඝ සභාව	240,000.00
එකතුව	**1,200,000.00**

01.5.6.10 බෞද්ධ විශ්වකෝෂය යාවත්කාලීන කිරීම

බෞද්ධ විශ්වකෝෂය යනු බුදු දහමට අදාළ සියලු විෂයයන්ගේ ප්‍රධාන සංකල්ප විවරණය කරන මූලික බෞද්ධ ග්‍රන්ථයයි.

ඒ අනුව ථෙරවාදී, මහායාන හා වජ්‍රයාන යන සියලු බෞද්ධ සම්ප්‍රදායන්ට අයත් බෞද්ධ දාර්ශනික හා සංස්කෘතික වටිනාකමකින් යුතු පුද්ගල, ග්‍රන්ථ, සංකල්ප මෙන්ම පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන ආදී සියල්ල පැහැදිලි කරමින් ලිපි රචනා කර ඇතුලත් කිරීම මෙම ග්‍රන්ථයේ සම්පාදාන ක්‍රියාවලියයි. එය කලානුරූපීව යාවත්කාලීන කළයුතු අතර ලෝකයේ බුදු දහම සංවර්ධන විමට සමගාමීව අඛණ්ඩව සංවර්ධනය වියයුතු කෘතියකි. මෙහි මූලික අරමුණ වන්නේ බුදු දහමට අදාළව අධ්‍යයනයක හෝ පර්යේෂණයක නිරත වන ලෝකයේ ඕනෑම විද්‍යාර්ථයෙකුට අවශ්‍ය මූලික කරුණු පිළිබඳ අවබෝධයක් ලබාදීමයි.

මේ හැරුණු විට බුදු දහම පිළිබඳ උනන්දුවක් දක්වන විද්වතෙකුට බුදු දහමේ දැක්වෙන ඕනෑම සංකල්පයක් පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට මෙම ග්‍රන්ථය ඉවහල් වේ. දැනට වෙළුම් ග්‍රන්ථ 08 ක් සම්පූර්ණ කර ඇති අතර ඉදිරියේ දී එය වෙළුම ග්‍රන්ථ 12 දක්වා වර්ධනය කිරීමට අපේක්ෂිතයි.

2022 වර්ෂයට බෞද්ධ විශ්වකෝෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 6.33 කි. ප්‍රධාන කර්තෘගේ වැටුප් ගෙවීම, නියෝජ්‍ය කර්තෘගේ වැටුප් ගෙවීම සහ බුද්ධජයන්ති පොත්හලේ හා වේයන්ගොඩ පොත් ගබඩාවේ අලෙවිය සඳහා පොත් අවසන් වී තිබුණු බැවින් බෞද්ධ විශ්වකෝෂයේ 4 වෙළුම පොත් 500ක් හා 6 වෙළුම පොත් 500ක් මුද්‍රණය කිරීම ඇතුළු සමස්ත වියදම රු. 6,036,812.00 ක් වැය විය.

01.5.6.11 බෞද්ධ විශ්වකෝෂය යාවත්කාලීන කර අන්තර්ජාලයට එක් කිරීම

ජාත්‍යන්තර බෞද්ධ ප්‍රජාව වෙත බෞද්ධ දැනුම් පද්ධතිය පුළුල් කරනු වස් මෙය සිදු කරනු ලබයි.මේ වන විට සුචි වෙළුම සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවති අතර මෙම වසර අවසානයේ සූචි වෙළුම පොතක් වශයෙන් මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. මීට අමතරව බෞද්ධ විශ්වකෝෂය අන්තර්ජාල ගත කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායනයේ අධ්‍යක්ෂ වෙත යොමු කරන ලද ලිපිය අනුව එම ආයතනය මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළයුතු ආකාරය සම්බන්ධයෙන් ඔවුන්ගේ නිර්දේශ හා නිර්ණායකයන් ඉදිරිපත් කර ඇත.

ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා දැනුම සහිත තොරතුරු තාක්ෂණ නිලධාරීන් මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කලයුතු ආකාරය පිළිබඳ කමිටුවක් පත්කර එම කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව අමාත්‍යාංශය වෙත යෝජනා කර ඇත.

01.5.6.12 මහානායක චාරිකාරාමය

මහානායක ස්වාමීන් වහන්සේලා අගනුවර වැඩ කටයුතු සඳහා වැඩම කරන විට අවශ්‍ය විටකදී නවාතැන් ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීමට කොළඹ විජයාරාම මාවතේ මහානායක චාරිකාරාමය වෙන් කර තිබේ. මෙහි සංවර්ධන කටයුතු සඳහා අනුමත කර ඇති මුදල රුපියල් මිලියන 16.308 කි. මෙහි අලුත්වැඩියා කටයුතු නාවික හමුදාව විසින් සිදු කරන අතර මෙම ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදී හඳුනාගත් අමතර කාර්යයන් හා වෙළඳපළ භාණ්ඩ මිල අධික ලෙස ඉහළ යාම ආදි කරුණු නිසා මෙම ප්‍රතිසංස්කරණ කාර්යයන් නිම කළ නොහැකිව ඇත.

චාරාකාරාම ගොඩනැගිල්ල සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රු. මිලියන 76.41 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත. 2022 වර්ෂය සඳහා රු. 6,500,000.00ක් මහානායක චාරිකාරාමය වැය ශීර්ෂය සඳහා වෙන් කර ඇති අතර 2022 වර්ෂයේ එම අලුත්වැඩියා කටයුතු සඳහා වියදම රු. 6,499,661.65 කි.

01.5.6.13 යටිතල පහසුකම් සංවර්ධන කටයුතු

01.5.6.13.1 මිහිඳු නිවහන නිවාස ව්‍යාපෘතිය

හිත නිවන ගත නිවහන හිත නිවනක් නැති මා පියන් වෙත පිදෙන පූජාවක් යන තේමාව යටතේ 2020 වර්ෂයේ සිට ආරම්භ කරන ලද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දෙමව්පියන් සඳහා නිවසක් සාදා දීමේ වැඩපිළිවෙල යටතේ අයදුම්පත් නිර්දේශය මෙමගින් සිදු කරනු ලබයි.2022.09.31 වන විට අයදුම්පත් 531 ක් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර එම සියලු ම අයදුම්පත්‍ර නිවාස අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

01.5.6.14 සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතන සංවර්ධනය

ලංකාවේ බෞද්ධ සමාජය තුළ කාන්තා විමුක්තිය ළඟා කරනු වස් මහානායක ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනා මත පිහිටුවා ඇති සිල් මෑණියන් සංවිධාන ශක්තිමත් කරනු වස් සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතන 03 ක් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබයි.

01.5.6.14.1 මුලටියන සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය

සිල්මෑණියන් වහන්සේලා 30 නමක් සඳහා පවත්වන ලද කෙටි කාලීන හා දිගු කාලීන පාඨමාලා වෙනුවෙන් රුපියල් 4,390,468.29 මුදලක් වැය කරන ලදී .





01.5.6.14.2 කැළණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය

තෙමහල් ගොඩනැගිල්ලේ වහල සුළු ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත.



01.5.6.14.3 අනුරාධපුර සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය

තිරය සහිත මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරය සවි කිරීම හා ආරක්ෂිත වැට ඉදිකිරීමද දාන ශාලාව ඉදිකිරීමේ පළමු අදියරද නිම කර ඇත.



01.5.6.15 බෞද්ධ කලාශිල්ප සහ බෞද්ධ ලේඛකාධාර ලබා දීම

බෞද්ධ සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා පෙරහැරවල් හා උපහාර උත්සව සඳහා ගෙවීම්ද විද්වතුන්ට සිදු කරනු ලබන උපහාරයක් ලෙස ලේඛකාධාර ලබාදීම කරනු ලැබේ. 2022 වර්ෂය සඳහා ගෙවීම් පහත පරිදි වේ.

බෞද්ධ කලා ශිල්ප සඳහා ගෙවීම්	පෙරහැර/උත්සව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	වෙන් කළ මුදල (රු.)
1.	ඓතිහාසික රයිගම්පුර ඔලබොඩුව නවම් මහා පෙරහැර මංගල්‍යය-ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රජ මහා විහාරය, ඔලබොඩුව- හොරණ.	කළුතර	හොරණ	12,500.00
එකතුව	**12500.00**			

01.5.6.16 බෞද්ධ ලේඛකාධාර ලබා දීම

අනු අංකය	ග්‍රන්ථයේ නම	කර්තෘ	මිල දී ගැනීම සඳහා වැය කළ මුළු මුදල(රු.)
1	බෞද්ධ රාජ්‍ය පරිපාලන මූල ධර්ම සහ භාවිතය	වජිර නාරම්පනාව	9,600.00
2	නිවන් මග හෙලි කරන සාමණේර පැන සමඟ දැවෙන සිත නිවන මග	ගරු වැකඩ භද්‍රා සිල්මැණියන් වහන්සේ	5600.00
එකතුව			**15,200.00**

01.5.6.17 ආගමික සිද්ධස්ථාන සඳහා සිව්පස ආධාර ලබා දීම

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රත්‍ය පහසුකම් සපයා ගැනීමට දුෂ්කර වූ විහාරස්ථාන 10 ක් සඳහා රු. 5,000.00 ක වටිනාකමින් යුත් වියළි සලාක මළු 10 ක් ලබා දීමට බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සමගින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.





01.5.6.18 රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව ඌන සංවර්ධිත දහම් පාසැල් සංවර්ධනය

රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය සඳහා දහම් පාසල් ගොඩනැගිලි හා උපකරණ ආධාර ලබාදීම වාර්ෂිකව සිදු කෙරේ. ඒ අනුව 2022 වර්ෂය සඳහා සබරගමු පළාත තුළ තෝරා ගත් දහම් පාසල් සඳහා ගොඩනැගිලි හා උපකරණ ආධාර ලබා දීම සිදු කර ඇත.

01.5.6.19 2022 රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව රත්නපුර දිස්ත්‍රික්කයේ දහම් පාසල් සංවර්ධන ව්‍යාපෘති හා ලබාදුන් ප්‍රතිපාදන

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ව්‍යාපෘතිය	ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මි.
01	රත්නපුර	බලංගොඩ	රාස්සගල, විජනත්කුඹුර ශ්‍රී ධර්මාශෝක දහම් පාසලේ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම	0.5
02	රත්නපුර	බලංගොඩ	මාවෙල, තලකොලහින්න ශ්‍රී රාහුල දහම් පාසලේ ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීම	0.5
03	රත්නපුර	බලංගොඩ	බලන්ගොඩ, රජවක සෝමානන්ද දහම් පාසලේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය	0.5
04	රත්නපුර	බලංගොඩ	තෙලදිරිය, මහවලතැන්න ශ්‍රී රතනානන්ද දහම් පාසලේ ගොඩනැගිල්ල (ධර්මශාලාව) ප්‍රතිසංස්කරණය කිරීම	0.5
05	රත්නපුර	වැලිගෙපොල	රංවල, බුළුවෙල ශ්‍රී විජයබෝධි දහම් පාසලේ ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීම	0.5
06	රත්නපුර	වැලිගෙපොල	රංවල, දෙල්වලකන්ද ශ්‍රී සුමනාරාම දහම් පාසලේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම	0.5
07	රත්නපුර	වැලිගෙපොල	රංවල ශ්‍රී සුගතානන්ද දහම් පාසලේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම	0.5
08	රත්නපුර	වැලිගෙපොල	මැදගම, පනාන ශ්‍රී ධර්මවිජය දහම් පාසලේ වැසිකිළි පද්ධතිය සකස් කිරීම	0.5
09	රත්නපුර	කල්තොට	බළන්ගොඩ, වැලිපත, අංක 01 ශ්‍රී ඥානිස්සර දහම් පාසලේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම	0.5
10	රත්නපුර	කල්තොට	බළන්ගොඩ, හඳගිරිය දියවින්න ශ්‍රී සද්ධානන්ද දහම් පාසලේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම	0.5
11	රත්නපුර	කල්තොට	බළන්ගොඩ, කල්තොට ශ්‍රී සුධර්මෝදය දහම් පාසලේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම	0.5
12	රත්නපුර	කල්තොට	බළන්ගොඩ, මොළමුරේ ශ්‍රී නාරද දහම් පාසලේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම	0.5
එකතුව				**6.0**







01.5.6.20 ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය සඳහා ආධාර ලබාදීම-2022

2021 වර්ෂයේ ආධාර ලබා දීම සඳහා තෝරාගත් එහෙත් ප්‍රතිපාදන නොයවන ලද, 2022 ප්‍රතිපාදන ලබාදුන් දහම් පාසල් සංවර්ධන ව්‍යාපෘති

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ව්‍යාපෘතිය	ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.
01	පුත්තලම	කරුවලගස්වැව	නෙලිවැව, සිරි මංගලාරාම විහාරස්ථ රාහුල දහම් පාසල සඳහා දහම් පාසල් උපකරණ ලබාදීම	0.25
02	පුත්තලම	කරුවලගස්වැව	නෙළුම්වැව බෝධිරුක්ඛාරාම විහාරස්ථ මයුරවංශ දහම් පාසල සඳහා දහම් පාසල් උපකරණ ලබාදීම	0.25
03	රත්නපුරය	අයගම	ගංගාරාම විහාරස්ථ ශ්‍රී සෝභිත දහම් පාසලේ ගොඩනැගිලි අලුත්වැඩියාව	0.5
04	නුවරඑලිය	කොත්මලේ	හල්ගොල්ල අංක- 02, ශ්‍රී සුගත දහම් පාසලේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම	0.5
05	කළුතර	මතුගම	යටදොළ ශ්‍රී විවේකාරාම විහාරස්ථ ශ්‍රී සීලවිසුද්ධි දහම් පාසලේ ගොඩනැගිල්ල ඉදිකිරීම	0.5
06	අනුරාධපුරය	නැ.නු.පළාත	විහාරමහාදේවී ආරාම දහම් පාසලේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම	0.5
07	අනුරාධපුරය	ගලෙන්බිඳුණුවැව	වැලැනගම, අලිවංගුව, උපුල්දෙණිය ශ්‍රී සුබෝධ දහම් පාසලේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම	0.5
08	මහනුවර	පාතදුම්බර	නාපාන, ගුන්නෑපාන ශ්‍රී ප්‍රියදර්ශනාරාම විහාරස්ථ ශ්‍රී මහින්ද දහම් පාසලේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම	0.5
09	කළුතර	පානදුර	පානදුර, ගල්තුඩේ සිද්ධත්ථාරාම විහාරස්ථ සිරි සිද්ධාර්ථ දහම් පසලේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු	0.5
එකතුව				**4.0**





01.5.6.22 පුහුණු වැඩසටහන්

01.5.6.22.1 "අංජලිකරණී"සිල්මාතා පුහුණු

ශ්‍රී ලාංකීය බෞද්ධ සමාජය තුළ බුදු දහමේ උන්නතිය හා චිරස්ථිතිය උදෙසා සිල්මෑණියන් වහන්සේලා විසින් ඉමහත් කර්තව්‍යයක් සිදු කරනු ලබයි.තවද වර්තමානය වන විට වර්ධනය වී ඇති සිල්මාතා පරපුර එම කරුණේ නිරවද්‍ය බව තව දුරටත් තහවුරු කරනු ලබයි. එසේ වුවද සිල්මෑණියන් වහන්සේලාට තම ශාසනික මෙහෙවර සිදු කරගැනීම සඳහා සමාජයෙන් ලැබෙන්නා වූ ධෛර්යය හා අත්වැල ප්‍රමාණවත් වන්නේ ද යන්න සිතා බැලිය යුතු කරුණක් වී ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ විවිධ පළාත් වල වැඩ වාසය කරන්නා වූ 3000 කට ආසන්න සිල් මෑණියන් වහන්සේලා විසින් බුදු දහම පිළිබඳ ශ්‍රද්ධාවෙන් යුතුව කටයුතු කරමින් සිටින නමුත් උන් වහන්සේලාගේ බුද්ධ ධර්මය පිළිබඳ දැනුම හා ශාස්ත්‍රීය ඥානය තවදුරටත් එමෙන්ම නිවැරදි ආකාරයෙන් වර්ධනය කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම අත්‍යවශ්‍ය කරුණක් වේ.


ඒ අනුව සිල් මෑණියන්වහන්සේලාගේ ධර්ම සන්නිවේදනය ,ධර්ම ශාස්ත්‍රීය දැනුම,ශාසනික වත්පිළිවෙත් පිළිබඳව දැනුවත් කිරීම, අධ්‍යාත්මික සංවර්ධනය, උපදේශනයහා ගිහි පැවිදි සම්බන්ධතාව පවත්වාගෙන යාම පිළිබඳ දැනුවත් කිරීම හා ඒ සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා වන වැඩසටහන් දෙකක් කැළණිය **සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය දී පැවැත්විය.**

සිල් මෑණියන්වහන්සේලාගේ ප්‍රත්‍ය පහසුකම් සහ ගමන් වියදම් දීමනා ඇතුලුව පුහුණු වැඩසටහන් දෙක සඳහා **රුපියල් මිලියන 0.55 ක් වැය කෙරිණ.**මේ සඳහා සිල් මෑණියන්වහන්සේලා 100 ආසන්න පිරිසක් සහභාගී විය. මීට අමතරව අනුරාධපුර නව සංඝමිත්තාරාමයේ දී සිල් මෑණියන්වහන්සේලා 75 ආසන්න පිරිසක් සඳහා දෙදින නේවාසික වැඩ මුළුවක් පවත්වන ලදී. මේ සඳහා රුපියල් ලක්ෂ තුනකට ආසන්න මුදලක් වැය කරන ලදි.





අනුරාධපුර නව සංඝමිත්තාරාමයේ පැවැති වෛද්‍ය සායනය සහ දෙදින නේවාසික වැඩමුළුව






01.5.6.23 2022 වර්ෂයේ සංවර්ධන අංශයේ ලියාපදිංචි කිරීම්

- සිල්මැණියන් වහන්සේලා ගණන - 284
- උපැවිදි වූ (සිල්මැණියන් වහන්සේලා) - 10
- සිල්මාතා ආරාම ගණන - 14
- විහාරස්ථ දායක සභා ගණන - 21
- ආරාම දායක සභා ගණන - 03

01.5.7 දහම් පාසල් අංශය

ඇමරිකන් ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගේ සංකල්පයකට අනුව 1895 අගොස්තු 03 වන දින ගාල්ල වැලිවත්ත ශ්‍රී විජයානන්ද විහාරස්ථානයේදී ප්‍රථම දහම් පාසල ආරම්භ කරන ලදී. එලෙස ආරම්භ වූ බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනය විසිවන සියවස ආරම්භයේදි දිවයින පුරා ව්‍යාප්ත වූ අතර වර්තමානය වන විට දිවයිනේ බෞද්ධ දහම් පාසල් 10,320ක් ක්‍රියාත්මක වන අතර සිසුන් 2,153,050ක් ඒවායේ දහම් අධ්‍යාපනය හදාරයි. ගුරු භවතුන් 126,090ක් නිස්සරණාධ්‍යාශයෙන් මේ සඳහා තම සේවය ලබාදේ.

“බුදු දහම පදනම් කරගෙන තමා සහ අවට පරිසරය පිළිබඳව නිවැරිදි අවබෝධයක් ඇති එම අවබෝධයට අනුව හැසිරෙන එසේ හැසිරීමේ ප්‍රතිඵල අත් දකින ගුණ නැණ බෙලෙන් යුතු දරු පිරිසක් බිහි කිරීම දහම් පාසල් අධ්‍යාපනයේ පරමාර්ථයයි.”

මෙම උතුම් පරමාර්ථය ලභාකර ගැනීම සඳහා දහම් පාසල් අධ්‍යාපනය මෙහෙයවීම දහම් පාසල් අංශය විසින් සිදුකරන අතර,ඒ සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර 4 යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1. දහම් පාසල් ශිෂ්‍ය සංවර්ධනය
2. දහම් පාසල් ගුරු වරුන් සංවර්ධනය
3. දහම් පාසල් කළමනාකරණය
4. වෙනත් වැඩසටහන්

මෙම ක්ෂේත්‍ර යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1.දහම් පාසල් ශිෂ්‍ය සංවර්ධනය

i. දහම් පාසල් පෙළපොත් මුද්‍රණය හා බෙදා හැරීම
ii. දහම් පාසල් 6-10 ශ්‍රේණි විභාගය පැවැත්වීම
iii. ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ සමස්ත ලංකා වශයෙන් සිසු නිපුණතා වැඩසටහන පැවැත්වීම

2.දහම් පාසල් ගුරුවරුන් සංවර්ධනය

1.දහම් පාසල් ගුරු දීමනා ලබා දීම
2.දහම් පාසල් නිල ඇඳුම් ලබා දීම
3.දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය පැවැත්වීම
4.දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම
5.දහම් පාසල් ගුරු කුසලතා සංවර්ධන පුහුණු වැඩමුළු පැවැත්වීම
6.සාමදාන විනිශ්චයකාර පදවි ප්‍රදානය කිරීම

3.දහම් පාසල් කළමනාකරණය හා සංවර්ධනය

1.වාර්ෂික ගුරු සිසු තොරතුරු රැස් කිරීම
2.දහම් පාසල් දින සැමරුම
3.දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සකස් කිරීම
4.දහම් පාසල් ලියාපදිංචි කිරීම
5.දහම් පාසල් කොඩි සතිය ක්‍රියාත්මක කිරීම

4.වෙනත් වැඩසටහන්

I. ත්‍රිපිටකය සරල සිංහලට පරිවර්තනය කිරීම
II. බුද්ධජයන්ති පොත් හල

01.5.7.1 දහම් පාසල් ශිෂ්‍ය සංවර්ධනය

(i)දහම් පාසල් පෙළපොත් මුද්‍රණය හා බෙදා හැරීම

සදාචාරවත් සමාජයක් බිහි කිරීම උදෙසා අත්‍යාවශ්‍ය වන දහම් පාසල් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන දහම් පාසල් පෙළ පොත් සංස්කරණය,මුද්‍රණය හා දහම් පාසල් වෙත බෙදා හැරීම දහම් පාසල් අංශය මඟින් සිදු කරනු ලබයි.

ප්‍රධාන වශයෙන් රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කරනු ලබන පෙළපොත් වේයන්ගොඩ පිහිටි දහම් පාසල් පොත් ගබඩාව හරහා ශාසනාරක්ෂක මණ්ඩල වෙත සෘජුවම බෙදා හරිනු ලැබේ.

2021 වසරේ පෙළපොත් 3,953,300 ක් මුද්‍රණය කළ අතර, ඉන් 50%ක් 2022 වසර සඳහා බෙදා දී ඇත. 2023 වසර සඳහා ඉතිරි පෙළපොත් 50% බෙදා හරිමින් පවතී.2022 වර්ෂය සඳහා පෙලපොත් මුද්‍රණය සඳහා ප්‍රතිපාදන වෙන් වී නොතිබූ අතර,පෙලපොත් බෙදාහැරීම සඳහා රු. මිලියන 6ක මුදලක් පවරා ගන්නා ලදී. මේ වන විට දහම් පාසල් පෙල පොත් බෙදාහැරීමේ කටයුතු ආරම්භ කර ඇත.

මුළු දිස්ත්‍රික්ක ගණන	= 22
ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ගණන	= 280
දහම් පාසල් ගණන	= 8000
බෙදා හරින ලද මුළු පොත් ගණන	= 1868896

(ii) දහම් පාසල් 6-10 ශ්‍රේණි විභාගය පැවැත්වීම

ශ්‍රී ලංකාව පුරා සියලුම දහම් පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ගේ දහම් දැනුම පරීක්ෂා කිරීමේ සහ ඔවුන් ඇගයීමේ අරමුණින් පවත්වනු ලබන මෙම ශ්‍රේණි විභාගය සෑම වසරකම නොවැම්බර් මස අවසානයේ පවත්වනු ලබයි.

2020 වර්ෂයේ විභාගය සඳහා මධ්‍යස්ථාන 10,262 ක අයදුම්කරුවන් 1,067,946 ඉදිරිපත් වීමට නියමිත වූවද COVID 19 වසංගත රෝග තත්වය නිසා දහම් පාසල් වසා තිබීම හේතුවෙන් විභාගය පැවැත්වීමට නොහැකිවිය. 2021 වසර ශ්‍රේණි විභාගය,2022 අප්‍රේල් 24 දින පවත්වන ලදී.ඒ සඳහා සහතිකපත් ලබා දීම මේ වෙන විට අවසන් කර ඇත. දහම් පාසල් ශ්‍රේණි විභාගය සඳහා 2022 වර්ෂයේ ප්‍රතිපාදන ලෙස රු මිලියන 22ක් වෙන්වී තිබූ අතර එය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් තවත් රු මිලියන 17.7ක් පවරා ගන්නා ලදී. 2022වර්ෂය අවසන් වන විට මෙම සියලු මුදල් වියදම් කර අවසන් විය.

2022 වසරේ දහම් පාසල් ශ්‍රේණි විභාගය රජයේ පාසල් වල තෙවෙනි පාසල් වාරය අවසානයේ, 2023 මාර්තු මස 26 දින පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

(iii) ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ සමස්ත ලංකා වශයෙන් සිසු නිපුණතා වැඩසටහන පැවැත්වීම

දහම් පාසල් සිසු දරුදැරියන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසාත්, බුදු දහමේ ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගැනීම සඳහා අවස්ථාව ලබාදීම මගින් ගුණ නැණ සපිරි දරු පරපුරක් බිහි කිරීම උදෙසා සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන වාර්ෂිකව පවත්වනු ලැබේ

2020, 2021 වසරවලදිවයිනේ උද්ගත වී තිබූ කොවිඩ් වසංගත තත්වය මෙන්ම ආර්ථික, ඉන්ධන අර්බුදය හා ඒ හා සැබෑදි ප්‍රයෝගික ගැටලු හේතුවෙන් ද 2022 වසර වෙනුවෙන් ඇගයීම් වැඩසටහන පැවැත්වීමට නොහැකි විය.

2023 වසර සඳහා වන වැඩසටහන වසර අවසානයේ පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් ඇත.

01.5.7.2 දහම් පාසල් ගුරුවරුන් සංවර්ධනය

(i) දහම් පාසල් ගුරු දීමනා ලබා දීම

නිශ්ශරණාධ්‍යාශයෙන් දහම් පාසල් ගුරු සේවයේ නියුතු ගුරු භවතුන් දිරි ගන්වමින් ඔවුන්ගේ සේවය අගයනු වස් දහම් පාසල් ගුරු සේවයේ අඛණ්ඩ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ වයස අවුරුදු 18ක් සම්පූර්ණ සෑම ගුරුවරයෙකුටම 2006 වසරේ සිට පුස්තකාල දීමනාව ප්‍රදානය කරනු ලබයි.

දහම්පාසල් ගුරු භවතුන් උදෙසා 2006 වසරේ සිට ලබාදුන් රුපියල් 2,000.00 ක පුස්තකාල දීමනාව සහ මාසිකව ලබාදුන් රු. 200.00 බැගින් වූ දහම් දිරිය දීමනාව එකට එකතු කර 2017 වසරේ සිට වාර්ෂිකව රු.5,000.00ක් ගුරු දීමනාවක් ලෙස ලබාදෙනු ලැබේ.


2022 වර්ෂය සඳහා රු.5,000.00 බැගින් මෙම දීමනාව ලබා දිය යුතු වුවද, පැවති ප්‍රතිපාදන තත්වය මත රු.3,300.00 බැගින් ගුරු දිමනාවක් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 323 ක දහම් පාසල්10,279 ක ගුරුභවතුන්11,1614 කටලබා දි ඇත. ලබා දුන් මුළු ප්‍රතිපාදන සංඛ්‍යාව රු. 368,326,200.00 කි. මේ සඳහා යොදාගනු ලැබුවේ දහම් පාසල් ගුරු භවතුන් සඳහා පහසුකම් සැපයීම වැය විෂය යටතේ වෙන් වී තිබූ ප්‍රතිපාදනයි.

(ii) දහම් පාසල් නිල ඇඳුම් ලබා දීම


නිශ්ශරණාධ්‍යාශයෙන් දහම් පාසල් ගුරු සේවයේ නියුතු ගුරු භවතුන් දිරි ගන්වමින් ඔවුන්ගේ සේවය අගයනු වස් දහම් පාසල් ගුරු සේවයේ අඛණ්ඩ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ වයස අවුරුදු 18ක් සම්පූර්ණ සෑම ගුරුවරයෙකුටම 2004 වසරේ සිට නිල ඇඳුමක් ප්‍රදානය කරනු ලබයි.

නිල ඇඳුමක් ලැබීම පිළිබඳ සෑම ගුරුවරයෙකු ම පසු වන්නේ යහපත් ආකල්පයකිනි. 2022වර්ෂය සඳහා නිල ඇඳුම් ලැබීමට ගුරු භවතුන් 98,790 ක් දෙදෙනෙකු සුදුසුකම් ලබා ඇත.මෙම ගුරුභවතුන් අතරින් 50,489 ක් සඳහා නිල ඇඳුම් ලබාදුන් අතර අනෙකුත් ගුරුභවතුන් 48,301 ක් සඳහා පිරිමි ගුරුභවතෙකුට රු.1,700.00 බැගින් හා කාන්තා ගුරුභවතෙකු සඳහා 2,500.00 බැගින් ප්‍රදානය කරන ලදී. මේ සඳහා රු 107,372,500.00ක ප්‍රතිපාදන ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත වෙන්කර යවන ලදි.මේ සඳහා යොදාගනු ලැබුවේ දහම් පාසල් ගුරු භවතුන් සඳහා පහසුකම් සැපයීම වැය විෂය යටතේ වෙන් වී තිබූ ප්‍රතිපාදනයි.

2023 වසරේ සිට රු. 2,500.00 ක නිල ඇඳුම් දීමනාවක් ලබා දීමට යෝජිත වුවද ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබී නොමැත.



දිස්ත්‍රික් මට්ටමින් 2022- දහම් පාසල් සංඛ්‍යාව-10320



(iii)දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය පැවැත්වීම

දහම් පාසල් ගුරුවරුන් හට සුවිශේෂ වූ හා ගුරුවරුන්ගේ ඉහළ ප්‍රතිචාරයක් පවතින දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය දැනට සේවයේ නියුතු දහම් පාසල් ගුරු භවතුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරාලීම, අධ්‍යාපන සුදුසුකම් ඉහළ දැමීම, ඔවුන්ගේ සේවය අගය කිරීම, දැනුම තව දුරටත් වර්ධනය කිරීම හා උසස් අධ්‍යාපනයට නැඹුරු කිරීම හරහා ඔවුන්ට සමාජ පිළිගැනීමක් ඇති කරලීම මෙන්ම, එමඟින් ඔවුන්ගේ සේවාව ජනතාවගේ ඇගයීමට ලක් කිරීම යන අරමුණු මූලික කර පවත්වනු ලැබේ.

2022 ජූනි මස18 දින පැවැත්වීමට නියමිතව තිබූ දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය දිවයිනේ ඒ වනවිට උද්ගතව තිබූ ආර්ථික අර්බුදය හා ඒ හා සැබැඳි ප්‍රයෝගික ගැටලු හේතුවෙන් සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ උපදෙස් පරිදි නොපවත්වන ලද අතර 2023 වසර සඳහා ගුරු සහතික පත්‍ර විභාගය 2023 ජූනි 17 දින පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

(iv) දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම

දහම් පාසල් ගුරුභවතුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමග එක්ව දිස්ත්‍රික් ලේකම් කාර්යාල 19 ක අධීක්ෂණය යටතේ දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලැබේ.මේ වන විට ගුරුවරුන් 10,000 කට අධික ප්‍රමාණයක් ඩිප්ලෝමාධාරීන් බවට පත් කර ඇති අතර, මේ වන විට මෙම පාඨමාලාව උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස වැඩි දියුණු කර ඇත.

2022 වර්ෂය සඳහා වර්ෂය මුලදී ප්‍රතිපාදන ලෙස රු මිලියන 2ක් වෙන්වී තිබූ අතර එම මුදල වැඩසටහන පවත්වාගෙන යාමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වර්ෂය අවසානයේදී තවත් රු මිලියන 6.5ක් පවරා ගන්නා ලදි. දහම් සරසවිය වැඩසටහනේ දේශක ගාස්තු ගෙවීම හා මධ්‍යස්ථාන වියදම් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත මේ වන විට රු.මිලියන 6.2ක ප්‍රතිපාදන වෙන්කර යවා ඇත.

2018/2019 බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සමග පවත්වන පාඨමාලාවේ දහම් පාසල් ගුරු භවතුන් 1544 ක් සඳහා සහතික පත් ප්‍රදානෝත්සවය 2023 ජනවාරි මස පැවැත්වීමට සැලසුම් කර ඇත.

2021/2022 ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ පාඨමාලාවේ පළමු වසර, දෙවන අර්ධ වාර්ෂික අධ්‍යයන කටයුතු 2022/10/01 දින සිට ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ.

(v) දහම් පාසල් ගුරු කුසලතා සංවර්ධන පුහුණු වැඩමුළු පැවැත්වීම


නිශ්ශරණාධ්‍යාශයෙන් විවිධ පාර්ශවයන් විසින් දහම් පාසල් ගුරුවරු පුහුණු කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, මෙම වැඩසටහන් නිශ්චිත ක්‍රමවේදයකට අනුව විධිමත්ව, නියාමනයක් යටතේ සිදු කිරීමේ අවශ්‍යතාවයක් පන නැගී ඇත.මේ සඳහා තෝරා ගත් ගුරු පුහුණු සම්පත් දායකයන් සංචිතයක් සකස් කර ඔවුන්ට මොඩියුල 04 ක් යටතේ විධිමත් පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වා ගුරු පුහුණු සංචිතයක් පිහිටු වීමට කටයුතු කරමින් පවති. එහි ප්‍රථම වැඩසටහන 2023 වර්ෂයේ පැවැත්වීමට කටයුතු කරමින් පවති.

01.5.3.2 දහම් පාසල් කළමනාකරණය හා සංවර්ධනය

(i) වාර්ෂික ගුරු සිසු තොරතුරු රැස් කිරීම


දහම් පාසල් ගුරුවරුන්ගේ සංවර්ධනය ඉලක්කකරමින් සැලසුම් සකස් කිරීම හා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. 2022 තොරතුරු අනුව ලියාපදිංචි දහම් පාසල් අතරින් දහම් පාසල් 10,297 ක් ක්‍රියාත්මක මට්ටමේ පවතින අතර ගුරුවරු 126,090ක් දහම් පාසල් ගුරු සේවාවෙහි නිශ්ශරණාධ්‍යාශයෙන් සේවයෙහි නියුක්තව සිටිති. සිසුන් 2,153,050 ක් ඒවායේ ඉගෙනුම ලබයි.

ශ්‍රී ලංකාවේ දහම් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය




වර්ෂය

2022 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 21 ක දහම් පාසල් 10320 ක ශිෂ්‍ය සංඛ්‍යාව 2,153,050කි.



වසර (ශ්‍රේණිය)

ගුරු සංඛ්‍යාව



වර්ෂය

(ii)දහම් පාසල් දින සැමරුම

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ දහම් පාසල වන ගාල්ල, වැලිවත්ත, විජයානන්ද දහම් පාසැල 1895 අගෝස්තු මස 03 වන දින ආරම්භ කර ඇති අතර එම දිනය සමරනු වස් සෑම වර්ෂයකම අගෝස්තු 03 වැනි දින ජාතික දහම් පාසැල් දින සැමරුම් ජාතික මහෝත්සවය පැවැත්වේ.

2022 වර්ෂයට යෙදුණු 127 වැනි දහම් පාසල් දින සැමරුම් ජාතික වැඩසටහන අගෝස්තු 03 දින අනුරාධපුර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර තිබූ නමුත්, රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ඒ වනවිට උද්ගතව තිබූ ආර්ථික අර්බුදයට අදාළ ප්‍රයෝගික ගැටලු හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය.

(iii) දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සකස් කිරීම

නිශ්ශරණාධ්‍යාශයෙන් දහම් පාසල් අධ්‍යාපනය ලබාදෙන වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති දහම් පාසල් ගුරුභවතුන් සඳහා මෙම හැඳුනුම්පත නිකුත් කරනු ලබයි.

2022 වසර සඳහා අයදුම්පත් 1,500 ක් ලැබී ඇති අතර, වෙන් වී ඇති ප්‍රතිපාදන මගින් දැනට නව හැඳුනුම්පතක් සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවති.

(iv) දහම් පාසල් ලියාපදිංචි කිරීම

ගුණ ගරුක සමාජයක් ඇති කිරීමේ අරමුණින් පිහිටුවා ඇති බෞද්ධ දහම් පාසල් සියල්ල බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ දහම් පාසල් අංශය විසින් ලියාපදිංචි කරනු ලැබේ.මෙසේ ලියාපදිංචිය සිදු කරන ලද දහම් පාසල්වලට මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන වැඩසටහන් හා සම්බන්ධ වීමට අවස්ථාව සැලසෙන අතර, පෙළ පොත් ලබාදීම , ගුරු නිල ඇඳුම් හා දීමනා ලබාදීම ආදී ප්‍රතිලාබ හිමිවේ . මේ වන විට ලියාපදිංචි දහම් පාසල් ගණන 11150කි.

(v) දහම් පාසල් කොඩි සතිය ක්‍රියාත්මක කිරීම

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ බුද්ධශාසනයේ විරස්ථිතිය හා දහම් පාසල්ගුරුභවතුන් මෙන්ම සිසු දරුවන්ගේ සුබ සාධනය සඳහා සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය මගින් ඉටු කරන කාර්යන්වලට මූල්‍යමය අනුග්‍රහය ලබා ගැනීමයි. ඒ අනුව සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස දහම් පාසල් කොඩි අලෙවිය සැලකේ. එය දහම් පාසල් දිනයට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබයි.

මේ යටතේ දහම් පාසල් ගුරුභවතුන් වෙනුවෙන් වකුගඩු, අක්මා, පිළිකා සහ හෘද රෝග සැත්කම් සඳහා රුපියල් ලක්ෂයක මූල්‍ය ආධාර පිරිනමන දහම් ගුරු සුවසවිය සටහන, දහම් පාසල්වල තෝරාගත් සිසු දරුවන්ට අ.පොෂ. උසස් පෙළ අධ්‍යාපන කටයුතු සඳහා ශිෂ්‍යාධාර සැපයීම, හදිසි ආපදා අවස්ථාවලදී ක්‍රියාත්මක කරනු ලබන පන්සලෙන් ගමට වැඩසටහන, දරුවෙකු සඳුන් ගත කළ අඩු ආදායම්ලාභී පදිංචියට සුදුසු නිවසක් අහිමි දෙමව්පියන් වෙත නිවසක් තනා ගැනීමට හෝ සංවර්ධනය කර ගැනීමට බුදුපුත් මව්පිය උපහාර නිවාස ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති රාශියක් ක්‍රියාවට නංවනු ලබයි.

රටේ පවතින ආර්ථික අර්බුදය නිසා2022 වර්ෂයේ දහම් පාසල් කොඩි සතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

4. වෙනත් වැඩසටහන්

(i) ත්‍රිපිටකය සරල සිංහලට පරිවර්තනය කිරීම

පාළි භාෂාවෙන් පමණක් පුස්කොළ පොත්වල ලියා තිබූ සම්පූර්ණ ත්‍රිපිටකගත පාළි ධර්මය ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 2500 (ක්‍රි.ව.1956) සම්පූර්ණ වීම නිමිත්තෙන් බෞද්ධ ජනතාවගේ ඉල්ලීම පරිදි, ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය මගින් පාළි ත්‍රිපිටකය සිංහල භාෂාවට පරිවර්තනය කර බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නමින් ග්‍රන්ථ පනස් හතක් (57) ලෙස මුද්‍රණය කර ඇත.

එම පරිවර්තනයන් තවදුරටත් සරල සිංහල භාෂාවට පරිවර්තනය කර පාඨකයන්ට කියවා තේරුම් ගැනීමට පහසු කරවනු වස් වර්ෂ 1993 දී පළමු කී බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ සිංහල පරිවර්තනය සරල සිංහල භාෂාවට නැවත ලිවීමට තීරණය කර, මහා නායක මහ තෙරුන් වහන්සේලාගෙන් සමන්විත සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයක් පිහිටුවා ඇත. මේ වන විට ඉහත ග්‍රන්ථ 57 න් 32 ක්, ග්‍රන්ථ 27ක් ලෙස පරිවර්තනය කර අවසන් කර ඇත.

එසේ පිහිටවන ලද මණ්ඩලය මගින් සම්පාදනය කරන ලද ත්‍රිපිටක ග්‍රන්ථ රජයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කර ජනතාව අතර ප්‍රචලිත කරනු ලබයි.

2022 වර්ෂයේ මේ සඳහා රු මිලියන 3ක ප්‍රතිපාදන වෙන්වී තිබූ අතර ,වර්ෂය අවසාන වන විට මෙම සියලු මුදල් වියදම් කර අවසන් විය.

(ii) බුද්ධජයන්ති පොත් හල

මහජනතාවගේ දහම් දැනුම වර්ධනයට මහත් සේ උපකාරී වන සුවිශේෂ දහම් පොත් රාශියක් මුද්‍රණ පිරිවැය පමණක් අය කර මහජනතාව වෙත ලබාදීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ඇති බුද්ධ ජයන්ති පොත්හල පවත්වාගෙන යනු ලබයි. සංක්ෂිප්තව සරල සිංහලයට නගන ලද ත්‍රිපිටක ග්‍රන්ථ හා බෞද්ධ විශ්වකෝෂ සිංහල හා ඉංග්‍රීසි බසින් රචිත බෞද්ධ විචාර පොත් රාශියක් මෙහි අලෙවිය සඳහා තිබේ. මේ වන විට ත්‍රිපිටකය සම්බන්ධ පොත් 37 ක්, බෞද්ධ විශ්ව කෝෂ (ඉංග්‍රීසි) පොත් 21 ක්,සිංහල බෞද්ධ විචාර පොත් හා සඟරා 04ක්, ඉංග්‍රීසි බෞද්ධ විචාර පොත් හා සඟරා 12 ක්, අලෙවිය සඳහා ඇත. 2022 වසරේ දෙසැම්බර් මාසය දක්වා පොත් අලෙවියෙන් රුපියල්16,026,153.00 ක මුදලක් ලැබී ඇත.

01.5.8 අභ්‍යන්තර විගණන අංශය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල සහ 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 4 (1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන වල අවධානම් කළමනාකරණය, යහපාලනය හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක වීම පිළිබඳ ස්වාධීන සහතිකයක් ලබා දීම හා උපදේශාත්මක කාර්යයක් සිදු කිරීම මෙන් ම එම සිද්ධස්ථාන විගණනයට ලක් කිරීම හා එම සිද්ධස්ථාන සඳහා මාර්ගෝපදේශ ලබාදීම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරයි.

01.5.8.1 ප්‍රධාන කාර්යයන්

- 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පවතින සියලුම සිද්ධස්ථානවල විගණන කටයුතු සිදුකිරීම.
- බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සියලුම විගණන කටයුතු සිදුකිරීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට සහය වීම.
- මනා ගිණුම් හා මූල්‍ය කළමනාකරණයකට සහය වීම.
- මනා සම්පත් භාවිතය තහවුරු කිරීමට සහය වීම.
- කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට සහය වීම.

01.5.8.2 අභ්‍යන්තර විගණන සැලැස්ම

සෑම වර්ෂයකම ජනවාරි 31 දිනට පෙර අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර අනුමත කර ගැනීමෙන් පසුව ඒ අනුව ක්‍රියා කරයි.

01.5.8.3 ඉදිරි ඉලක්ක

2023 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්ම ජනවාරි 31 දිනට පෙර අනුමත කර ඇති අතර, 2023 වර්ෂයේ සිදු කිරීමට සැලසුම් කර ඇති විගණනයන්හි සංයුතිය පහත පරිදි වේ.

අයිතමය	සිදුකිරීමට සැලසුම් කරඇති විගණන වාර්තාවන් ගණන
සිද්ධස්ථාන වල පරිපාලන කටයුතු හා මූල්‍ය කටයුතු සම්බන්ධ විගණනයන්	23
දෙපාර්තමේන්තුව තුළ විගණනයන්	06
ප්‍රාදේශීය කාර්යාල/ සිල්මාතා පුහුණු මධ්‍යස්ථාන විගණනයන්	03
වෙනත් විමර්ශනයන්	-
කළමනාකරණ කමිටු රැස්වීම(කාර්තුගතව)	04
එකතුව	**36**

01.5.8.4 විශේෂ ජයග්‍රහණ (අභියෝග)


2022 වර්ෂයේ මුල් කාර්තුවේ රට තුළ පැවති කොවිඩ් අර්බුදය හා වසර පුරා පැවති ආර්ථික දුෂ්කරතාවයන් මෙන්ම රජයේ දැඩි මූල්‍ය පාලනය තුළ විගණන සැලැස්මට අනුගතව විගණන කාර්යයන් සිදුකර 97% ක ප්‍රගතියක් වාර්තා කිරීමට සමත් වීම අභ්‍යන්තර විගණන අංශය ලැබූ ජයග්‍රහණයක් ලෙස දැක්විය හැක.

01.5.8.5 ප්‍රගතිය

2022 වර්ෂයේ විගණන සැලැස්මට අනුව පහත සඳහන් අයිතමයන් යටතේ විගණනයන් සිදු කළ අතර එහි ප්‍රගතිය පහත පරිදි සාරාංශගතව ඉදිරිපත් කළ හැක.

අයිතමය	සිදුකිරීමට සැලසුම් කර තිබූ විගණන වාර්තාවන් ගණන	සිදුකළ විගණන වාර්තාවන් ගණන	ප්‍රගතිය
සිද්ධස්ථාන වල පරිපාලන කටයුතු හා මූල්‍ය කටයුතු සම්බන්ධ විගණනයන්	17	17	**100%**
දෙපාර්තමේන්තුව තුළ විගණනයන්	13	12	**93%**
ප්‍රාදේශීය කාර්යාල/ සිල්මාතා පුහුණු මධ්‍යස්ථාන විගණනයන්	03	03	**100%**
වෙනත් විමර්ශනයන්	02	02	**100%**
කළමනාකරණ කමිටු රැස්වීම(කාර්තුගතව)	04	04	**100%**
එකතුව	**39**	**38**	**97%**

විවිධ උත්සව, රැස්වීම් සංවිධාන කටයුතු සම්බන්ධ විගණනය අභ්‍යන්තර විගණන සැලැස්මට අන්තර්ගතව තිබුණු නමුත් රට තුළ පැවති තත්ත්වය මත දෙපාර්තමේන්තුව විසින් උත්සව, රැස්වීම් සංවිධාන නොකිරීම හේතුවෙන් විගණනයක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවුණි.



2022 වර්ෂයේ ඉදිරිපත් කර ඇති විගණන වාර්තා

01. අම්මඩුව කුඩා කතරගම දේවාලය
02. ශ්‍රී මහා කතරගම දේවාලය
03. සපරගමුව මහ සමන් දේවාලය
04. ශ්‍රී දළදා මාලිගාව
05. පොත්ගුල් රජමහා විහාරය
06. දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලය
07. බොල්තුඹේ සමන් දේවාලය
08. විල්බාව ශ්‍රී පත්තිනි දේවාලය
09. උග්ගල් අලුත් නුවර කතරගම දේවාලය

10. මහනුවර ශ්‍රී මහා නාථ දේවාලය
11. සීනිගම ශ්‍රී මහා දෙවොල් දේවාලය
12. ඊරියවැටිය සිල්මාතා මූලස්ථානය හා පුහුණු අධ්‍යාපන ආයතනය
13. නිල සංචිත වාහන නඩත්තුව පිළිබඳ විගණන විමසුම (වාර්තා 2)
14. අනුරාධපුර නව සංඝමිත්තා ආරාමය සම්බන්ධ විගණන වාර්තාව
15. කිරිවෙහෙර රජමහා විහාරස්ථානය විගණන වාර්තාව
16. මුලටියන පියදාස රත්නායක අනුස්මරණ සිල්මාතා අභ්‍යාස ආයතනයේ විගණන වාර්තාව
17. දෙපාර්තුමේන්තු ගොඩනැගිලි නඩත්තු කටයුතු පිළිබඳ විගණනය
18. රාජ්‍ය නිලධාරීන්ගේ ඇප තැන්පතු තැබීම්
19. සුළු මුදල් සම්බන්ධ විගණන වාර්තාව
20. දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන විගණනය (වාර්තා 2)
21. කොටබෝව කුඩා කතරගම දේවාලය
22. මැදගොඩ පත්තිනි දේවාලය
23. දහම් පාසල් ගුරු බවතුන්ගේ නිල ඇදුම් හා පුස්තකාල දීමනා සම්බන්ධ වාර්තාව
24. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා අපහරණ කටයුතු පිළිබඳ විගණනය (වාර්තා 2)
25. පැල්මඩුල්ල රජමහා විහාරය
26. ශ්‍රී පාදස්ථාන රජමහා විහාරය
27. 2022 රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව පළමු කාර්තුවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිපාදන ලබා දුන් ඌන සංවර්ධිත දහම් පාසල් වල ප්‍රගතිය විගණනය
28. මහියංගනය රජමහා විහාරය
29. මුතියංගනය රජමහා විහාරය
30. දඹුල්ල රජමහා විහාරය

ඉහත විගණනයන්ට අමතරව පහත කාර්යයන් ඉටුකර ඇත.

- වර්ෂයට අදාළ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 පැවැත්වීම.
- 2023 වර්ෂයට අදාළ විගණන සැලැස්ම අනුමත කර ඇත.
- දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන අනෙකුත් කටයුතු වලට සහය දැක්වීම.

01.5.9 බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය - මහනුවර

මහනුවර, මාතලේ, කෑගල්ල, නුවරඑලිය සහ බදුල්ල දිස්ත්‍රික්කයේ මුතියංගණ රජමහා විහාරය, මහියංගණ රජමහා විහාරය, මහියංගණ සමන් දේවාලය ඇතුළත් බෞද්ධ විහාර දේවාල ගම් ආඥා පනතේ 4(1) සහ 4(2) වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළු සිද්ධස්ථාන 92 ක් සහ අනෙකුත් සිද්ධස්ථාන 2580 ක ප්‍රමාණයක රාජකාරී කටයුතු ආවරණය කිරීම මෙම කාර්යාලය මගින් සිදු කරනු ලැබේ. තවද ප්‍රාදේශිය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන විහාරස්ථාන සංවර්ධන කාර්යයන් , දහම් පාසල් ශිෂ්‍ය ප්‍රජාව හා ගුරුභවතුන් සම්බන්ධ කටයුතු මෙන්ම බෞද්ධ සමිති සමාගම් වලට අදාළ කටයුතු ද බෞද්ධ ප්‍රජාවගේ අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් විශාල ප්‍රමාණයක් ප්‍රාදේශිය වශයෙන් දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් මෙම කාර්යාලය මගින් ඉටු කරනු ලබයි.

01.5.9.1 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී දළදා මාළිගාව, සතර මහා දේවාල හා පිටිසර දේවාල සඳහා දියවඩන නිළමේ සහ බස්නායක නිලමේවරු පත්කිරීමේ ඡන්ද කටයුතු සිදු කිරීම.
- පාලනය වන විහාරස්ථාන සහ දේවාල සඳහා භාරකරුවන් පත්කිරීම.
- භාරකාර ඇප මුදල් තැන්පත් කිරීම සහ නිදහස් කිරීම.
- සිද්ධස්ථාන වල දේපළ භාරකරුවන්ට භාරදීම.
- විහාර දේවාලවලට අයත් ඉඩම් බදු දීම.
- ප්‍රවේණි අයිතිවාසිකම් පවරා ගැනීම පිළිබඳ ලේඛන පවත්වාගෙන යාම.
- වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම, පරීක්ෂා කිරීම, මුදල් නිදහස් කිරීම.
- විහාරස්ථාන ආරවුල් සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- ශ්‍රී දළදා පෙරහැර, උපසම්පදා කටයුතු වලට සහාය වීම.
- දහම් පාසැල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගී වීම හා සහාය වීම.

01.5.9.2 ඉදිරි ඉලක්ක

1. මෙම කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන බදු ගොණුවල බදු ගිවිසුම අවසන් වූ බදු ගොණු සම්බන්ධයෙන් සිද්ධස්ථාන භාරකරුවන් දැනුවත් කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරීම.

2. සිද්ධස්ථානවලට අයත් ඉඩම් බදු ලබාදීම සම්බන්ධ දත්ත අන්තර්ජාලය මූලික කර ගත් පරිගණකගත දත්ත පද්ධතියක් තුළ ඇතුළත් කිරීම ආරම්භ කළ අතර 2022 වසර අවසාන වන විට එම කටයුත්තට අදාළව 80% පමණ ප්‍රතිශතයකින් අවසන් කරන ලදී. 2023 පළමු කාර්තුව අවසාන වන විට එම දත්ත ඇතුළත් කිරීම අවසන් කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.

3. ඉහත සඳහන් දත්ත පද්ධතියේ යාවත්කාලින කිරීම් මත වසර පහෙන් පහට බදු මුදල් සංශෝධනය කිරීම සම්බන්ධ ලිපිගොනු යාවත්කාලින කිරීමේ කටයුතු පහසු කර ගැනීමට කටයුතු කිරීම.

4. ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ට අනුකූල වන පරිදි මෙම කාර්යාලය මගින් වෙනත් ආයතන වෙත යවන ලිපි කිහිපයක් එකම කවරයක බහා යොමු කිරීමත්, ආසන්න ආයතන හා සිද්ධස්ථානවලට අදාළ ලිපි අතින් භාරදීමට කටයුතු කිරීමටත් වැඩපිළිවෙළක් සකස් කර ඇත. ලිපි ද්‍රව්‍ය වියදම් අවම කිරීමට A4 කඩදාසියේ ලිපි දෙකක් මුද්‍රණය කිරීම සිදු කරමින් පවතී. තවදුරටත් මෙම කාර්යාලය තුළ වියදම් අවම කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම.

5. මෙම කාර්යාලය මගින් පාලනය වන සිද්ධස්ථාන 92ට අදාළව එක් එක් සිද්ධස්ථානයේ සියළු තොරතුරු ඇතුළත් වාර්තාවක් සකස් කිරීම. එම වාර්තාවට සිද්ධස්ථානයේ ඡායාරූප, භාරකරු සම්බන්ධ විස්තර, ප්‍රවේශ මාර්ගය, සිද්ධස්ථානය සතු ඉඩම්, බදු ඔප්පු ප්‍රමාණය යනාදී තොරතුරු ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ.තෝරාගත් සිද්ධස්ථානවල මෙම කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ශ්‍රමදාන සිදු කිරීම හා අඩු පහසුකම් සහිත සිද්ධස්ථානවල සංවර්ධන කටයුතු සිදු කිරීමට රාජ්‍ය ආයතන හා සිද්ධස්ථානවල සහයෝගය ලබා ගැනීමට වැඩපිළිවෙලක් 2023 වර්ෂයේදී සකස් කිරීම.

01.5.9.3 සමාජ සුබසාධන හා දැනුවත් කිරීමේ වැඩසටහන්

1. සිද්ධස්ථාන ඉඩම් බදු දීමේදී ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා නිරවුල්භාවය පිළිබඳ වාර්තාව සැපයීමේදී වසම භාර ග්‍රාම නිලධාරීවරයාට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයේ නිලධාරීන්ට බදු දීමට යෝජිත ඉඩම් කොටස නිශ්චිතව හඳුනා ගැනීමේ අපහසුතා පවතින බව නිරන්තරයෙන් දැනුම්දෙනු ලැබේ. ඒ අනුව සිද්ධස්ථානය සතු ඉඩම් පිළිබඳව සිද්ධස්ථාන භාරකරුවන්ද සම්බන්ධ කර ගනිමින් අදාළ පාර්ශවයන් වෙත තොරතුරු ලබා දීම හා දැනුවත් කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම.

2. මහනුවර දිස්ත්‍රික්කය තුළ තෝරාගත් දහම් පාසල් කිහිපයක සිසුන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය කිරීම සඳහා සම්පත් දායකයන්ගේ සහයෝගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

3. ශ්‍රී පාද වන්දනා සමය අවසන් වූ පසු මෙම කාර්යාලයේ නිලධාරීන් හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පරිසරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම.

01.5.9.4 විශේෂ අභියෝග

1. පදිංචිය සඳහා බදු ලබා දීමේදි නාගරික මෙන්ම ග්‍රාමීය ඉඩම් සඳහා එක සමාන බදු මුදලක් අය කිරීම හේතුවෙන් ඉස්මතු වන අසමතුලිතතාවය නිසා සිද්ධස්ථාන ඉඩම් බදු වශයෙන් ලබා ගැනීමට එම ඉඩම් වල භුක්ති කරුවන් ඉදිරිපත් නොවීම හා එම ඉඩම් ආරක්ෂිත නොවීම මෙන්ම ආදායම් අහිමි වීම.

2. ප්‍රවේණි ඉඩම් බැහැර කිරීමේදි එසේ බැහැර කර මාසයක් ඇතුළත බෞද්ධ කටයුතු කොමසාරිස් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇතත් ඉඩම් බැහැර කිරීමට පෙර දැනුවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් රාජකාරි ඉඩම් සිද්ධස්ථානයෙන් බැහැර වීම හා අන්‍ය ආගමිකයන් අතට පත් වීම.

3. නිරන්තර සිහිකැඳවීම් සිදු කරන නමුත් සිද්ධස්ථානවල අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අය වැය වාර්තා නිසි වේලාවට ලබා නොදීම හා ඒ සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමට නොහැකි වීම.

4. සිද්ධස්ථානවල ඉඩම් සම්බන්ධ තොරතුරු අදාළ සිද්ධස්ථානයේ භාරකරුවන් භාරයේ තිබෙන අතර ඔවුන් විසින් ලබා දෙන තොරතුරු පමණක් මෙම කාර්යාලයේ ඇත. ඉඩම් බදු දීමේ කටයුතු හා ඉඩම් සම්බන්ධ ගැටළුකාරී අවස්ථාවලදී අවශ්‍ය වන තොරතුරු භාරකාරයාගෙන් ලබා ගත යුතු වන අතර ඇතැම් අවස්ථාවල ඒ සඳහා ඔවුන්ගෙන් නිවැරදි තොරතුරු ලැබීම අවම මට්ටමක පවතී.

5. සිද්ධස්ථාන ඉඩම් බදු දීමේදී ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා නිරවුල්භාවය පිළිබඳ වාර්තාව සැපයීමේදී වසම භාර ග්‍රාම නිලධාරීවරයාට හා ඊට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන්ට, බදු දීමට යෝජිත ඉඩම් කොටස නිශ්චිතව හඳුනා ගැනීමේ අපහසුතා පවතී.

6. රාජකාරි ලිපිගොණු විශාල ප්‍රමාණයක් මෙම කාර්යාලය සතුව තිබෙන අතර ඒවා ආරක්ෂිත ලෙස ගබඩා කිරීම සඳහා පවතින කබඩ් ප්‍රමාණවත් නොවීම හා විනාශ කළ නොහැකි පැරණි ලිපිගොණු ආරක්ෂිතව තබා ගැනිමට ලේඛනාගාරය තුළ ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීම.

01.5.9.5 ප්‍රගතිය

2023 වර්ෂයට අදාළ පොදු තොරතුරු සාරාංශය

- නිකුත් කර ඇති බදු අයදුම්පත් සංඛ්‍යාව - 548
- අවසන් කර ඇති බදු ඔප්පු සංඛ්‍යාව - 282
- තක්සේරු සඳහා යවා ඇති ලිපි ගණන - 204
- ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන - 32
- කාර්යාල පරීක්ෂණ ගණන - 43
- විහාරාධිපති තහවුරු කිරීම් ලිපි - 00
- භාරකරුවන් පත් කිරීමේ සංඛ්‍යාව - 16
- බස්නායක නිළමේවරු පත් කිරීම - 06
- භාණ්ඩ භාර දීම - 10
- මුදල් නිදහස් කළ සංඛ්‍යාව - 43
- ගස් කැපීම - 122
- ශ්‍රමදාන - 02
- පඩුරු මුදල් රාජකාරි අවස්ථා - 96
- විභාග වෙමින් පවතින නඩු - 19
- 2022.12.31 වන විට අවසන් වූ නඩු - 02

01.5.10 බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය - කුරුණෑගල

බෞද්ධ විහාර දේවාල ගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන විහාරස්ථාන 45 ක් සහ දේවාල 6ක් ඇතුළුව අනෙකුත් සියළුම විහාරස්ථාන වල රාජකාරී කටයුතු ආවරණය කිරීම මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලැබේ

1.5.10.1 ප්‍රධාන කාර්යයන්

- සිද්ධස්ථාන වල අනුමත හා අර්ධ වාර්ෂික ගිණුම් වාර්තා හා අනුමාන අයවැය ඇස්තමේන්තු ගෙන්වා ගැනීම
- පාලනය වන සිද්ධස්ථානවලට භාරකරුවන් පත් කිරීම
- විහාර දේවාල වලට අයත් ඉඩම් බදු දීම
- අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ දේපල සම්බන්ධ අවශ්‍ය රාජකාරී කටයුතු සිදු කිරීම , බැංකු ගිණුම්වල මුදල් නිදහස් කිරීම
- සිද්ධස්ථානවල ඉඩම්වල ගස් හෙලීම සඳහා අනුමැතිය ලබා ගැනීම
- භාරකාර දෙපාර්තමෙන්තුවේ ඇති මුදල් සංවර්ධන කාර්යයන් සඳහා නිදහස් කිරීම
- සාමනේර උපසම්පදා සහතික නිකුත් කිරීම
- විහාරස්ථාන ඉඩම්වල පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික කටයුතු සඳහා අනුමැතිය ලබා දීම
- මධ්‍යම අධිවේගී මාර්ගයට අත්පත් කරගත් විහාර ඉඩම්වල වන්දි මුදල් නිදහස් කිරීමට අදාළ කටයතු
- රජයේ සංවර්ධන කාර්යයන් සඳහා විහාරස්ථාන ඉඩම් ලබා ගැනීමට අනුමැතිය ලබා දීම
- දහම්පාසල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගි වීම

01.5.10.2 ඉදිරි ඉලක්ක

1. අනුමාන අයවැය සැකසීම ක්‍රමවත් කිරීම
2. අවිධිමත් ඉඩම් පරිහරනය විධිමත් කිරීම
3. සිද්ධස්ථානවලට අයත් නිවැරදි භාණ්ඩ ලේඛන සකස් කිරීම හා ඉඩම් පිළිබඳ නිවැරදි වාර්තාවක් සකස් කිරීම
4. ඓතිහාසික වටිනාකමක් සහිත සිද්ධස්ථානවල තොරතුරු ඇතුලත් පොත් සකස් කිරීම
5. ඉඩම් සම්බන්ධ ගැටළු හැකිතාක් දුරට නිරවුල් කිරීම හා බදු දීමට අදාල කටයුතු විධිමත් කිරීම
6. භාරකරුවන් පත් කිරීමට අදාළ කාර්යයන් නිවැරදිව සිදු කිරීම

01.5.10.3 විශේෂ ජයග්‍රහණ (අභියෝග)

1. නිරන්තර සිහිකැදවීම සිදු කරන නමුත් සිද්ධස්ථාන වල අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අයවැය වාර්තා නිසි වේලාවට ලබා නොදීම හා ඒ සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමට නොහැකි වීම.
2. නිලධාරීන්ට රාජකාරී ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් තරම් කාර්යාල මේස හා පුටු නොතිබීම නිසා රාජකාරී ඉටුකිරීම සඳහා අපහසුතා ඇති වීම.
3. විහාරස්ථාන කිපයක විහාරාධිපති ධූරය දැරූ ස්වාමීන් වහන්සේනමක් අපවත් වූ විට එම බැංකු ගිණුම්වල මුදල් නිදහස් කිරීමේ දී නිශ්චිත විහාරස්ථානය තොරා ගැනීමේ ගැටළු පවතීම
4. පැරණි බදු ලිපිගොනු යාවත් කාලීන කර විහාරස්ථානයට නැවත බදු මුදල් ලබා දීමට කටයතු කිරීම

01.5.10.4 ප්‍රගතිය

- භාරකරුවන් පත් කිරීමේ සංඛ්‍යාව - 18
- විහාරස්ථාන ඉඩම් බදු දීම - 74
- සාමනේර /උපසම්පදා සහතික නිකුත් කිරීම - 135
- විහාරස්ථාන වල ගැටළු විසඳීම - 06
- විහාරස්ථාන වල අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ මුදල් නිදහස් කිරීම - 07
- ක්ෂේත්‍ර පරීක්ෂණ - 180

01.5.11 බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය - රත්නපුර

01.5.11.1 හැඳින්වීම

බෞද්ධ කටයුතු දෙපාරතමේන්තුවේ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය 1982/10/11 වන දින රත්නපුර මුවගම සිරිවිසුද්ධාරාම විහාරස්ථානයේදී සිව් දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයකින් යුක්තව ආරම්භ කර ඇත.ඉන් අනතුරුව වරතමානයේ බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාරයාලය ස්ථාපිත කර ඇති රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීරණය වෙත 1985/06/15 වන දින රැගෙන විත් ඇත. වර්තමානය වන විට පහත පරිදි කාර්ය මණ්ඩලය දොළොස් දෙනෙක් සේවය කරනු ලබයි.

තනතුර	ප්‍රමාණය
සහකාර කොමසාරිස් (තාවකාලික වැඩ බලන)	01
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි	01
සංවර්ධන නිලධාරි	04
කළමනාකරණ සේවා නිලධාරි	04
කාර්යාල කාර්යය සහායක	01
බහුකාර්ය සහායක (රියදුරු)	01

රත්නපුර, මොණරාගල, බදුල්ල යන දිස්ත්‍රික්ක වලට අදාළව 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව,

දිස්ත්‍රික්කය	4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන	4(2) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන
රත්නපුර	20	574
මොණරාගල	11	373
බදුල්ල	07	398
එකතුව	**38**	**1345**

01.5.11.2.ප්‍රධාන කාර්යයන්

1. 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත යටතේ හා උප නීති යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට සහාය වීම.
2. විශේෂයෙන්ම 4(1) පාලනයේ පවතින සිද්ධස්ථාන වල ඉඩම්, මූල්‍ය හා වත්කම් පාලනයට සහාය වීම හා ඒවා ආරක්ෂා කිරීමට විධිවධාන සැලසීම
3. 4(2) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන සතු සාංඝික දේපළ ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
4. රත්නපුර, මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්ක වල සිද්ධස්ථාන වල අභිවෘද්ධිය ඇති කිරීම හා පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම හා සහයෝගය ලබා දීම.

5. සිද්ධස්ථාන සතු පෞරාණික අංගෝපාංගයන් ආරක්ෂා කර ගනිමින් අවශ්‍ය නිවැරදි මග පෙන්වීම් ලබා දීම.
6. සිද්ධස්ථාන සතු දේපල නිසි කළමණාකාරීත්වයෙන් යුක්තව පරිහරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම හා ඒ සම්බන්ධව පසු විපරම් සිදු කිරීම.
7. ආගමික හා සංස්කෘතික අංගයන් ආරක්ෂා කිරීමට මගපෙන්වීම හා සහයෝගය ලබා දීම.

01.5.11.3. ප්‍රගතිය

අප කාර්යාලය මගින් 2022 වර්ෂය තුළ සිදුකර ඇති රාජකාරි කටයුතු සැකෙවින්

අනු	රාජකාරි කටයුතු	දිස්ත්‍රික්කය			මුළු ගණන
		රත්නපුර	බදුල්ල	මොණරාගල	
01	භාරකරුවන් පත් කිරීම (අදාළ තොරතුරු විහාර දේවාලගම් අංශයට යොමු කිරීම පමණක් සිදු කෙරේ)	නැත	01	01	02
02	ඉඩම් බදු දීම	40	62	58	160
03	බදු මුදල් සංශෝධනය කිරීම්	22	72	44	138
04	දැව හෙළීම් හා ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීම	66	නැත	58	124
05	අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේලා සතු බැංකු ගිණුම් වලින් මුදල් නිදහස් කිරීම්	08	07	04	19
06	පූජා ඔප්පු ලබා දීමට අනුමැතිය දීම	නැත	නැත	නැත	00
07	වන්දි මුදල් හා පොළී මුදල් නිදහස් කිරීම්	නැත	නැත	02	02
08	විහාරස්ථාන සතු ඉඩම් හා වෙනත් ගැටළු නිරාකරණය කිරීම	44	04	12	60
09	මැණික් ගැරීමට නව බලපත්‍ර දීර්ඝ කිරීමට නිර්දේශ කිරීම				224
10	මැණික් ගැරීමට දී ඇති බලපත්‍ර දීර්ඝ කිරීමට නිර්දේශ කිරීම				
11	බදු ආදායම්				රු.82 210 800.00
12	දැව ආදායම්				රු.1 152 290.00
13	පඩුරු ආදායම				රු.58 722 632.00
14	මුදල් නිදහස් කිරීම්				රු. 1 101 240.00

04. මෙම කාර්යාලය මගින් සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂණ හා කාර්යාල පරීක්ෂණ මගින් සිද්ධස්ථාන වල පවතින ආරවුල් සඳහා විසඳුම් ලබා දීමට හැකි වූ අතර සිද්ධස්ථාන සතු ඉඩම් වල බදු ගෙවීම් පැහැර හැරීම්, නීත්‍යානුකූල බදු නොගෙවීම් ගැනද විශේෂ අවධානය යොමු කර ඇත.

05.විහාර දේවාගලම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සපරගමු මහ සමන් දේවාලය, රුහුණු මහා කතරගම දේවාලය, කිරිවෙහෙර රජ මහා විහාරය, සෙල්ලකතරගම මහසෙන් රජමහා විහාරය යන සිද්ධස්ථාන වල වසරක් තුළදී අවස්ථා කිහිපයකදීම පඩුරු ගණනය කිරීම හා බැංකු ගත කිරීම අධීක්ෂණය කිරීම මෙම කාර්යාලයේ කාර්යය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

01.5.11.4. ඉදිරි ඉලක්ක

- 2022 වර්ෂයේ ඉටු කළ කාර්යයන් වල අඩුපාඩු මගහරවා ගනිමින් ඒවා තව දුරටත් වැඩි දියුණු කිරීම
- වඩාත් ඵලදායී කාරයක්ෂම සේවයක් ලබා දීමට අවශ්‍ය පහසුකම් සලසා දීම
- සිද්ධස්ථාන සතු වත්කම් සහ දේපළ හඳුනා ගෙන ඒවා තව දුරටත් ආරක්ෂා කිරීම සඳහා කටයුතු යෙදීම

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2022 දී ක්‍රියාත්මක වූ ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය

අනුඅංකය	වැඩසටහන/ව්‍යාපෘතිය	2022 අයවැය මඟින් ප්‍රතිපාදන ලැබීම් රු.(මි.ලි)	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය 2022.12.31 දිනට (රු.මි.)	විශේෂිත කරුණු
1.	ජාතික වෙසක් උත්සවය	1.00	0%	0.00	
2.	සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතන වල මෙහෙයුම් කටයුතු	5.3	100%	5.3	-
3.	සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතන වලට පහසුකම් සැපයීම	0.5	80%	0.4	
4.	ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රියාත්මක කිරීම	8.3	67%	5.61	
5	කලාශිල්ප	0.05	100%	0.05	
6	විද්වතුන්ට උපහාර	0.05	100%	0.05	
7	බෞද්ධ ග්‍රන්ථ කතුවරුන්ගේ ප්‍රකාශන මිලදී ගැනීම	0.05	100%	0.05	
8	නිකාය මූලස්ථාන රියදුරු දීමනා	1.2	100%	1.2	
9	දසසිල් මාතා දිස්ත්‍රික් හා ජාතික මණ්ඩල රැස්වීම්	2.5	100%	2.5	
10	ආදාහන පූජෝත්සව	12.37	60%	7.43	
11	දසසිල්මාතා පුහුණු වැඩසටහන්	2	100%	2	
12	දහම් පාසැල් සඳහා පහසුකම් සැපයීම	34.2	62%	21.4	
13	ශාසනාරක්ෂක මණ්ඩල සඳහා පහසුකම් සැපයීම	0.8	26%	0.21	
14	භික්ෂු පුහුණු වැඩසටහන්	1.7	100%	1.7	
15	ප්‍රත්‍ය පහසුකම් සඳහා	0.2	100%	0.2	
16	ගුරු සහතික පත්‍ර	3.5	11%	0.4	ආර්ථික අර්බුදය හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක නොවූ අතර චක්‍රලේඛ යොමු කිරීම පමණක් සිදුවිය
17	සිසු නිපුණතා වැසසටහන	28	1.42%	0.4	ආර්ථික අර්බුදය හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක නොවූ අතර චක්‍රලේඛ යොමු කිරීම පමණක් සිදුවිය
18	දහම් පාසැල් ශ්‍රේණි විභාග	22	100%	22	
19	දහම් සරසවි හා උසස් ඩිප්ලෝමාව	6.5	69%	4.5	
20	ත්‍රිපිටකය	3	100%	3	
21	නිදහස් දින පිරිත් පිංකම හා බෞද්ධාගමික වතාවත්	1.2	100%	1.2	
22	උපසම්පදා උත්සව	3.98	96%	3.85	

2.2 ඉදිරි ඉලක්ක

2023 දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති හා වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	2023 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රතිපාදන/ඉලක්ක රු.(මී.ලී)	2023 ඉදිරි දැක්මට අනුව ඉලක්ක
1.	ජාතික වෙසක් උත්සවය	1.00	100%
2.	ජාතික සිල්මාතා පුහුණු වැඩසටහන	2.5	100%
3.	බෞද්ධ භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම	1.5	100%
4.	ජාතික නිදහස් පිරිත	0.7	100%
5.	දහම් පාසැල් පෙල පොත් මුද්‍රණය	163	100%
6.	දහම් පාසැල් දින සැමරුම	1	100%
7.	සිසු නිපුණතා ජාතික වැඩසටහන	28	100%
8.	දහම් පාසැල් ගුරු පුහුණු	2	100%
9.	දහම් පාසැල් ගුරුවරුන් සඳහා දීමනා	650	100%
10.	දහම් පාසැල් ගුරු සහතික පත්‍ර	4.00	100%
11.	දහම් පාසැල් ශ්‍රේණි විභාග	80.00	100%
12.	බෞද්ධ විශ්වකෝෂය මුද්‍රණය	5.00	100%
13.	ත්‍රිපිටක ප්‍රකාශනය	3	100%



පරිච්ඡේදය 03 - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-එස්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තක්සා 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිතම		587,184,000	605,003,000	ඒසිඒ-3
-	කැන්පතු		4,067,861	4,780,185	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		24,956,060	24,116,866	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		616,207,861	633,900,051	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		616,207,861	633,900,051	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,438,915	1,071,988	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		614,768,946	632,828,063	
	අඩු කළා : වියදම්				
-	ප්‍රතිහරණ වියදම්		-	-	
512,400,000.00	වැටුප්, වෙනත් සහ අනෙකුත් සේවක ප්‍රති.	5	500,720,337	446,383,447	
126,900,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	101,131,514	87,085,511	ඒසිඒ-2(ii)
577,700,000.00	සභානාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	529,910,595	864,712,077	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් ප්‍රතිහරණ වියදම්	9	-	-	
1,217,000,000.00	මුළු ප්‍රතිහරණ වියදම් (ඊ)		1,131,762,447	1,398,181,035	
	මූලධන වියදම්				
3,400,000.00	මූලධන වත්කම් ප්‍රතිහරූපනය හා වැඩිදියුණු කිරීම්	10	4,367,228	895,572	
11,600,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	16,484,776	14,050,961	
44,000,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	27,698,071	52,283,745	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-		
500,000.00	තැකියා වර්ධනය	14	291,390	780,484	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
59,500,000.00	මුළු මූලධන වියදම් (උ)		48,841,465	68,010,762	
	කැන්පතු ගෙවීම්		2,748,690	5,148,553	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		31,295,883	28,045,173	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		34,044,573	33,193,726	
	මුළු වියදම් ඔ = (ඊ+උ+ඌ)		1,214,648,485	1,499,385,523	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඔ)		(599,879,539)	(866,557,460)	
	අයිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(599,879,539)	(866,557,460)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අයිම ශේෂය		1,438,915	1,071,988	ඒසිඒ-3
			-	-	

1

3.2 මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	209,098,947	179,675,989
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	75,677,217	70,837,104
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		
මුළු වත්කම්		**284,776,164**	**250,513,093**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		74,293,106	70,772,104
දේපළ පිරියත හා උපකරණ සංචිතය		209,098,947	179,675,979
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංශම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	1,384,111	65,000
අඩුම ශේෂය	ඒසිඒ-3		
මුළු වගකීම්		**284,776,164**	**250,513,083**

පිටු අංක 4 සිට 47 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 48 සිට 83 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාපෘතිකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 28/02/2023	දිනය : 28/02/2023	දිනය : 27/02/2023

සුනන්ද කාරියප්පෙරුම
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
දහම්මානය, අංක 135,
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

එල්. ඩී. පී. ප්‍රනාන්දු
ප්‍රධාන ගණකාධිකාරි
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
"දහම් පාය", අංක 135,
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 7.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022 **රු.**	**2021** **රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	28,912,026	25,445,172
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	587,184,000	605,003,000
අත්තිකාරම් අයකර ගැනීම්	25,577,848	24,107,249
තැන්පතු ලැබීම්	4,067,801	4,780,185
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**645,741,675**	**659,335,606**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	552,537,952	488,743,634
සහනාධාර සහ මාරුකිරීම්	34,177,376	115,387,575
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,675,377	498,989
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,438,915	1,071,988
අත්තිකාරම් ගෙවීම්	30,809,521	28,045,173
තැන්පතු ගෙවීම්	2,748,690	5,148,553
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**624,387,831**	**638,895,912**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**21,353,844**	**20,439,694**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ		-

	-	
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	21,353,844	20,439,694
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**21,353,844**	**20,439,694**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(21,353,844)**	**(20,439,694)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය (රු.000)

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොලිය-අනෙකුත්	2,500	2,500	3,020	121%
20.03.99.00	විකිණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	700	700	4,529	647%

3.6වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය (රු.000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණය % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1157000	1209917	1131763	94%
ප්‍රාග්ධන	88000	66583	48842	73%

3.7මු.රෙ 208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (රු.000)

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණය % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	වැටුප් ගෙවීම	2433.2	2433.2	1969	80.90%
2	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	වෙසක් උත්සවය	695.9	695.9	598.9	86%

3.8මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය(රු.000)

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	76482
9152	යන්ත්‍රෝපකරණ	95644
9153	ඉඩම්	8500
9154	අස්පෘශ්‍ය වත්කම්	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-
9160	කෙරීගෙන යන වැඩ	16003
9180	බදු දෙන ලද වත්කම්	12469

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඒ/සී/ඩීබීඒ/02/2022/05 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 10 දින

10 MAY 2023
මුද්‍රණ අංශය

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, ව්‍යයම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මු. රෙ. 66 යටතේ මාරුකරන ලද ප්‍රතිපාදන ඉතිරිවීම.

වැය විෂයයන් සඳහා ඇස්තමේන්තුවෙන් වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේයයි සලකා 201-2-11-2205 දහම් පාසල් ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහන හා දහම් සරසවිය වැඩසටහන වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරන ලද රු.6,500,000 ක ප්‍රතිපාදනයෙන් රු. 2,778,350 ක් වියදම් නොකර ඉතිරි කර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 43 කි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

2023 මාර්තු 11 දිනැතිව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී විසින් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී අමතන ලද GP/F/B/01/37 අංක දරන ලිපිය ප්‍රකාරව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් ඉටු කරගන්නා ලද මුද්‍රණ කටයුතු වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති මුදල රු. 24, 830,199 ක් වේ. එසේ වුවද, ඒ සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදු කර නිවැරදිතාවය තහවුරු කර ගෙන නොතිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.3 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ	
(i) මූදල් රෙගුලාසි 103 (1) (ආ) හා 1642	වාහන සම්බන්ධයෙන් සිදු වන සියළුම හදිසි අනතුරු ළඟම ඇති පොලිසියට වාර්තා කළ යුතු වන අතර එසේ වාර්තා නොකළහොත් ඒ සම්බන්ධව තදින් ක්‍රියා කළ යුතු වුවත් ආසන්න වර්ෂ 03 ක් තුළදී අනතුරු 03 ක් සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර නොතිබුණු අතර වාහන 2 කට අදාළ අනතුරු ප්‍රමාද වී වාර්තා කර තිබුණි
(ii) මූදල් රෙගුලාසි 104(4)	අලාභයක් සිදුවූ දිනයේ සිට තුන් මාසයක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් 2020 සිට 2022 වර්ෂය දක්වා කාලසීමාව තුළ සිදු වූ අනතුරු 11ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මාස 03 සිට වර්ෂයකට අධික කාලයක් දක්වා විය.
(iii) මූදල් රෙගුලාසි 156 (අ), (ආ) හා 1641	උක්ත සඳහන් මූදල් රෙගුලාසි ප්‍රකාරව, රජයට හෝ රජයේ දේපලකට සිදු වන පාඩු හෝ අලාභහානි සම්බන්ධයෙන් ඊට අදාල නිලධාරියා

වග කිව යුතු වන අතර එම නිලධාරියාට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු වේ. එසේ වුවද, වගකිවයුතු පුද්ගලයින් පරීක්ෂක මණ්ඩලය විසින් හඳුනාගෙන තිබුණු අනතුරු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඉන් එක් අනතුරක් සම්බන්ධයෙන් රියදුරු අධිකරණය ඉදිරියේ වරදකරු වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.2 වගන්තිය

වාහනවල බාහිර අළුත්වැඩියාවකදී ටෙන්ඩර් හෝ මිල ගණන් කැඳවීම් කළ යුතු වුවද 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල වාහන 11 ක් අලුත්වැඩියා කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව අළුත්වැඩියාවන් සිදු කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

(අ) 2020 අගෝස්තු 21 දිනැති 02/2020 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වන වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වේ. එසේ වුවද, 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේ වියදම් දැරීම සඳහා අනුමැතිය ලබා දී තිබූ 2021 අංක 30 දරන විසර්ජන පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද 2022 සැප්තැම්බර් 02 දිනැති 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධිත) සම්මත වීමෙන් පසු ඊට අනුකූලව සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වන "බෞද්ධ සාරධර්ම අගයන ඉණගරුක නිර්මාණශීලී ජන සමාජයක් ඇතිකිරීම" සඳහා සිදු කරනු ලබන කාර්යයක් වශයෙන් බෞද්ධ දහම් පාසැල් අධ්‍යාපනය පවත්වා ගෙන යාම, වැඩිදියුණු කිරීම හා දහම් පාසැල් සංවර්ධනය කිරීම සඳහා ගෙන තිබුණද දහම් පාසැල් සිසු නිපුණතා ඇගයීම් හා දහම් පාසල් ගුරු සහනික පත්‍ර විභාගය සඳහා 2022 වර්ෂය සඳහා පිළිවෙලින් රු.මිලියන 28 ක් හා රු.මිලියන 3.5 ක් වශයෙන් මූලික ඇස්තමේන්තුවෙන් වෙන් කර තිබූ ප්‍රතිපාදන භාවිතා කර නොතිබුණි. රාජ්‍ය වියදම් පාලනය කිරීමේ අරමුණින් නිකුත් කර තිබූ 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 අංක දරන ජාතික අයවැය චක්‍රලේඛය පදනම් කර ගනිමින්

ඉහත වැඩසටහන් පවත්වා නොනිබුණු බව නිරීක්ෂණය විය. තවද, 2021 වර්ෂයේදීද ඉහත වැඩසටහන් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.මිලියන 32.69 ක ප්‍රතිපාදනය මු.රෙ 66 යටතේ වෙනත් වැය විෂයන් සඳහා මාරු කර තිබුණු අතර දහම් පාසල් ගුරුවරුන්ගේ සහතික විභාගය හා සමස්ත ලංකා දහම් පාසල් තරඟය පවත්වා නොතිබුණි.

(ආ) දහම් පාසැල් සඳහා පහසුකම් සැලසීම සඳහා මූලික ඇස්තමේන්තුවෙන් රු.මිලියන 75 ක් වෙන් කර තිබූ අතර සංශෝධිත ඇස්තමේන්තුවේ එම මුදල රු.මිලියන 40.7 ක් විය. එම ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළ වැය කර තිබූ මුදල, දහම් පාසැල් ගොඩනැඟිලි සඳහා රු. මිලියන 6 ක් සහ උපකරණ ලබා දීම සඳහා රු. මිලියන 4 ක් වශයෙන් රු. මිලියන 10 ක් පමණක් විය.

3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 21 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 වගන්තිය ප්‍රකාරව වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 අගෝස්තු 08 දින වේ.

3.2 වත්කම් කළමනාකරණය

(අ) 2022 වර්ෂයේදී කැලණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය පවත්වා ගෙන යාම සඳහා රු.මිලියන 2 කට ආසන්න වියදමක් දරා තිබුණද වර්ෂය තුළදී දින 04 කදී පමණක් පුහුණුවීම් පවත්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ ඉතිරි කාලසීමාව නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) අනුරාධපුර අරිප්පුව පිහිටි සංඝමිත්තා සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය පවත්වා ගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේදී දැරූ වියදම රු.මිලියන 1.5 ක් වුවද 2022 දෙසැම්බර් මාසයේ 09 සහ 10 යන දෙදින සිල් මැණියන් වහන්සේ 50 නමක් සඳහා පමණක් පුහුණුවීම් පවත්වා තිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

(අ) වාහන අනතුරු පරීක්ෂාව

(i) අනතුරක් සිදු වූ විට වාහනය මෝටර්රථ පරීක්ෂකවරයෙකු /මෝටර්රථ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබා ගත යුතු වන අතර අළුත්වැඩියාවෙන් පසුව අදාළ අලුත්වැඩියාව නිසි පරිදි සිදුකර ඇති බවට සහතිකයක් ලබා ගැනීමෙන් පසුව ගෙවීම් කළ යුතු වේ. එසේ වුවද, 2020 – 2021 කාලපරිච්ඡේදය තුළ අනතුරට ලක් වූ වාහන 04 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) අනතුරට පත් වූ වාහන අළුත්වැඩියාව සහ ඊට අදාළ රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් සිදු කර ගිණුම් තැබීම සිදු කළ යුතු වුවත් ඒ වෙනුවට දෙපාර්තමේන්තුවේ අනුදැනුම මත රක්ෂණ ආයතනයෙන් ලැබෙන වන්දි මුදල් සෘජුවම ගරාජය වෙත ගෙවීමේ වැරදි ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි.ඒ

අනුව අනතුරට පත් වූ වාහන 05 කට අදාළ රක්ෂණ වන්දි මුදල් ඍජුවම චෙක්පත් මගින් ගරාජ වෙත ගෙවා තිබුණි.

(iii) අනතුරට ලක් වූ වාහනවල රියදුරන් හා ඇතැම් නිලධාරීන් අනතුර පිළිබඳව පොලිසියට පැමිණිලි කිරීමෙදී විමර්ෂණ අවශ්‍ය නොවන බව හා රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පමණක් පැමිණිල්ල සිදු කරන බවට ප්‍රකාශ කර තිබුණි. ඒ අනුව වාහනවලට පූර්ණ රක්ෂණ ආවරණයක් පැවතීම හේතුවෙන් නිලධාරීන් වගකීමෙන් තොරව කටයුතු කර තිබූ බව නිරීක්ෂණය කෙරේ.

(ආ) මහානායක වාරිකාරාමය ප්‍රතිසංස්කරණය

(i) වර්තමානය වන විට රු.මිලියන 22.81 ක මුදලක් වැය කර ඇති මහා නායක වාරිකාරාමයේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් 4.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණු අතර 2021 අප්‍රේල් මාසයේදී ආරම්භ කර තිබුණු අලුත්වැඩියා කටයුතු මෙම වාර්තාවේ දිනය වන විටත් අවසන් කර නොතිබුණි.

(ii) අදාළ මහා නායක වාරිකාරාම ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩමේ අයිතිය මෙම වාර්තාවේ දිනය වන විටත් පවරා ගෙන නොතිබුණි.

(ඇ) කැලණිය ථිරියවැටියේ දස සිල් මාතා මූලස්ථානය ඉදි කරන ලද ඉඩම, 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේගේ කැමැත්ත ප්‍රාදේශීය ලේකම්වරයා වෙත දැනුම් දී වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වුවද මෙතෙක් ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නීතිමය අයිතිය තහවුරු කර ගෙන නොතිබුණි.

(ඈ) මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 01 සිට 03 දක්වා කාල පරාසයකට අයත් රු. 114,330 ක සහ සේවය හැර ගිය නිලධාරියෙකුගේ අයවිය යුතු වර්ෂ 04 කට වැඩි කාලයක සිට පැවත එන රු. 134,710 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් 44 ක් සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තනතුරුවල පුරප්පාඩු 91 ක් පැවති අතර ඒ තුළ නියෝජ්‍ය හා සහකාර කොමසාරිස් තනතුරු 03 ක්, බෞද්ධ කටයුතු

සමායෝජක තනතුරු 38 ක්, සංවර්ධන සහකාර තනතුරු 25 ක් සහ රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 13 ක් විය. එසේ වුවද, එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2001 අගෝස්තු 22 දිනැති 18/2001 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05 ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත් දෙපාර්තමේන්තුව තුල වර්ෂ 05 සිට වර්ෂ 21 ට වැඩි කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් 571 ක් සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණු අතර එය 2022 දෙසැම්බර් 31 දිනට 752 ක් වූ දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් සියයට 76 කි.

එච්.එම්.රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04- කාර්ය සාධන දර්ශක

විහාර දේවාලගම් අංශය ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
විහාරස්ථාන ලියාපදිංචිය		85%	
විහාරාධිපති ධූරයට පත් කිරීමේ ලිපි පිළිගැනීම	90%		
විහාරාධිපති ධූර සම්බන්ධයෙන් අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේ වෙතින් තහවුරු කිරීම/විමසීම			67%
නව සිද්ධස්ථාන සම්බන්ධයෙන් වාර්තා ලබා ගැනීම		75%	
සිද්ධස්ථාන සතු දේපළ බදු දීම			64%
අනුමාන අයවැය වාර්තා ගෙන්වා ගැනීම		81%	
අර්ධ වාර්ෂික අයවැය වාර්තා ගෙන්වා ගැනීම		77%	

භික්ෂු ලියාපදිංචි අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
	100%-90 %	75%-89 %	50% - 74 %
ලියාපදිංචි කරන ලද සාමණේර ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව	92 %		
ලියාපදිංචි කරන ලද උපසම්පදා ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව	94 %		
නිකුත් කරන ලද සාමණේර, උපසම්පදා සහතික පිටපත් සංඛ්‍යාව		89%	
නිකුත් කරන ලද උපැවිදි සහතික සංඛ්‍යාව		85%	
ලියාපදිංචි කරන ලද සහතික වල සිදු කරන ලද සංශෝධන සංඛ්‍යාව		88%	
නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත් සංඛ්‍යාව		80%	

මහනුවර ප්‍රාදේශීය කාර්යාලය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	89% - 75%	74% - 50%	50%ට අඩු
1. අයවැය වාර්තා				
2022 වර්ෂය තුළදී පළමු අර්ධ වාර්ෂික වාර්තා ලැබීම් (39/92)	-	-	-	42%
2022වර්ෂය තුළදී දෙවන අර්ධ වාර්ෂික වාර්තා ලැබීම්(39/92)	-	-	-	42%
2022 වර්ෂය සඳහා අනුමාන අයවැය වාර්තා ලැබීම් (68/92)	-	-	74%	
2022වර්ෂය තුළදී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය (අපේක්ෂිත ප්‍රමාණය 15 සත්‍ය ප්‍රමාණය 13) **	-		73%	

**** 2022 වර්ෂය තුළ රටේ පැවති අයහපත් ආර්ථික තත්වය මත පැවැත්වීමට අපේක්ෂා කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය පැවැත්වීමට නොහැකි විය.**

කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100%-90%	89%-75%	74%-50%	50%ට අඩු
අයවැය වාර්තා				
2022 වර්ෂය තුළ දී පළමු අර්ධ වාර්ෂික වාර්තා		76%		
2022 වර්ෂය තුළ දී දෙවන අර්ධ වාර්ෂික වාර්තා			64%	

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0-49	50-74	75-100
1.ආධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණ දරුවන් බිහි කිරීම	දහම් පාසල් සඳහා භෞතික පහසුකම් සැපයීම	දහම් පාසල් වල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය			√
2. සාමාජීය,ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් පුර්ණ පුද්ගලයින් බිහි කිරිම	සාමාජීය,ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් පුර්ණ පුද්ගලයින් බිහි කිරිම	සාමාජීය,ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් පුර්ණ පුද්ගලයින් බිහි වීම			√
3. සාසනික විරස්ථිතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් සාමණේර භික්ෂු පුහුණුව	සාමණේර භික්ෂුන් වහන්සේලා පුහුණු කිරිම.	ආධ්‍යාත්මික වශයෙන් පරිපුර්ණ භික්ෂු සමාජයක් බිහි වීම			√
4. මිහිඳු නිවාස ව්‍යාපෘතිය	ශාසනයට තම දරුවන් භාර දුන් නිවාස නොමැති දෙමාපියන්ට නිවසක් ලබාදීම	2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මිහිඳු නිවාස අයදුම්පත් 208ක් නිවාස අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.			√

5.2තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක අතරින් ‘‘තිරසර සංවර්ධනය පිණිස සාමකාමී හා සංයුක්ත සමාජ ප්‍රවර්ධනය උදෙසා සැමට ප්‍රවේශය ලබා දීම සහ ඵලදායී වගවීම සහිත සංයුක්ත ආයතන ගොඩනැගීම’’යන 16 වන සංවර්ධන ඉලක්කය සපුරා ගැනීමට මෙම දෙපාර්තමේන්තුව මගින් සෘජු දායකත්වයක් ලබා දීම සිදු වේ.

ඒ අනුව යමින් ළමා සමාජය ඵලදායී හා විනය ගරුක කිරීම සඳහා බෞද්ධාගමික ඉගැන්වීම් වෙනුවෙන් ඉරිදා දිනයන්හි බෞද්ධ විහාරස්ථාන ආශ්‍රිතව දහම් පාසල් පද්ධතියක් ක්‍රියාත්මක වන අතර ස්වේච්ඡා ගුරුවරුන්ගෙන් පමණක් දහම් පාසල් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සිදු වී තිබීමත්, ඉරිදා දින දරුවන් සඳහා වෙනත් උපකාරක පන්ති පැවැත් වීම මත දරුවන් දහම් පාසල් වෙත පැමිණීම දුර්වල වීමත් ළමා සමාජය තුළ දහම් දැනුම වර්ධනය කිරීමට පවතින බාධාවන් වේ.

ජනගහනයෙන් බහුතරයක් බෞද්ධ ජනතාව දිවයින පුරා විසිරී සිටියද දුෂ්කර ප්‍රදේශවල පිහිටි සමහර විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා නොසිටීම හෝ අල්ප වශයෙන් සිටීමද ජනතාවට ලබා දිය යුතු ශාසනික මෙහෙවර ලබා දීමට බාධාවක් වී ඇත.

එසේ වුවද, පවතින සම්පත් ප්‍රශස්ත මට්ටමින් උපයෝගී කර ගනිමින් 2022 වර්ෂය තුළ නියමිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ අතර ව්‍යපෘතින්හි භෞතික ප්‍රගතිය ඉහළ ප්‍රතිශතයක් ගැනීමෙන් ඒ බව තහවුරු වේ.

තවද මෙම දෙපාර්තමේන්තුව ලබාගත් ජයග්‍රහණ අතර 2018 වසරට අදාලව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවට අනුව ඉහළ කාර්යය සාධනයක් අත්කරගත් ආයතන සඳහා සම්මාන පිරිනැමීමේදී 2020.02.28 දින පාර්ලිමේන්තුවේ පැවති සම්මාන ප්‍රදාන උත්සවයේදී මෙම දෙපාර්තමේන්තුව රන් සම්මානයක් හිමිකර ගැනීමට සමත් විය.

එමෙන්ම 2018 හා 2019 වර්ෂය සඳහා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ රජය අංශයෙහි හොඳම ගිණුම් වාර්තා කිරීමේ ආයතන අතරට පැමිණීමට ද හැකිවීම ලබාගත් සුවිශේෂී ජයග්‍රහණයකි.

06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

අංකය	තනතුර	බැටුම් ක්ෂේත්‍ර අංකය	ශ්‍රේණිය	ශ්‍රේණිය ගණය	පන්තිය/ ශ්‍රේණිය	අනුමත සේවක සංඛ්‍යාව			සේවයේ නියුතු නිලධාරී සංඛ්‍යාව			පුරප්පාඩු
						ස්ථිර	කොන්ත්‍රාත්	වැඩබැලීම	ස්ථිර	කොන්ත්‍රාත්	වැඩබැලීම	
01	බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්	SL 3-2016	ශ්‍රී.ලං.ප.සේ	ජ්‍යෙෂ්ඨ	විශේෂ	1	0	0	1	0	0	0
02	අතිරේක කොමසාරිස් ජනරාල්	SL 3-2016	ශ්‍රී.ලං.ප.සේ	ජ්‍යෙෂ්ඨ	විශේෂ	1	0	0	1	0	0	0
03	බෞද්ධ කටයුතු කොමසාරිස්	SL 1-2016	ශ්‍රී.ලං.ප.සේ	ජ්‍යෙෂ්ඨ	I	4	0	0	1	0	3	0
04	ප්‍රධාන ගණකාධිකාරී	SL 1-2016	ශ්‍රී.ලං.ග.සේ	ජ්‍යෙෂ්ඨ	I	1	0	0	1	0	0	0
05	ප්‍රධාන අභ්‍යන්තර විගණක	SL 1-2016	ශ්‍රී.ලං.ග.සේ	ජ්‍යෙෂ්ඨ	I	1	0	0	1	0	0	0
06	නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්	SL 1-2016	ශ්‍රී.ලං.ප.සේ	ජ්‍යෙෂ්ඨ	II/ III	6	0	0	3	0	0	3
07	ගණකාධිකාරී	SL 1-2016	ශ්‍රී.ලං.ග.සේ	ජ්‍යෙෂ්ඨ	II/ III	1	0	0	1	0	0	0
08	නීති නිලධාරී	SL 1-2016	දෙපාර්තමේන්තුගත	ජ්‍යෙෂ්ඨ	III	1	0	0	1	0	0	0
09	ප්‍රධාන කර්තෘ	SL 1-2016	කොන්ත්‍රාත්	ජ්‍යෙෂ්ඨ		0	1	0	0	1	0	0
10	උප කර්තෘ	SL 1-2016	දෙපාර්තමේන්තුගත	ජ්‍යෙෂ්ඨ		1	0	0	1	0	0	0
11	නියෝජ්‍ය/ සහකාර කර්තෘ	SL 1-2016	කොන්ත්‍රාත්	ජ්‍යෙෂ්ඨ		0	2	0	0	1	0	1
12	පරිපාලන නිලධාරී	MN 7-2016	ක.සේ.නි.සේ.	තෘතියික	අධි	1	0	0	1	0	0	0
13	ව්‍යාපෘති නිලධාරී	MN 4-2016	ආශ්‍රිත නිලධාරී	ද්විතියික		2	0	0	0	0	0	2
14	බෞද්ධ කටයුතු සමායෝජක	MN 4-2016	ආශ්‍රිත නිලධාරී	ද්විතියික		245	0	0	207	0	0	38
15	සංවර්ධන සහකාර	MN 4-2016	ආශ්‍රිත නිලධාරී	ද්විතියික		38	0	0	13	0	0	25
16	ගිණුම් සහකාර	MN 4-2016	ආශ්‍රිත නිලධාරී	ද්විතියික		1	0	0	0	0	0	1
17	සහකාර නීති නිලධාරී	MN 4-2016	ආශ්‍රිත නිලධාරී	ද්විතියික		1	0	0	1	0	0	0
18	සංවර්ධන නිලධාරී	MN 4-2016	සං.නි.සේ	ද්විතියික		452	0	0	452	0	0	0
19	කළමනාකරණ සේවා නිලධාරී	MN 2-2016	ක.සේ.නි.සේ.	ද්විතියික	I/ II/III	51	0	0	38	0	0	13
20	රියදුරු	PL 3-2016	ඒ.රි.සේ	ප්‍රාථමික		12	0	0	12	0	0	0
21	බංගලා භාරකරු	PL 2-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	0	0	0	1
22	කාර්යාල සේවක සේවය	PL 1-2016	කා.සේ.සේ.	ප්‍රාථමික	I/ II/III	20	0	0	15	0	0	5
23	ලොරි සහායක	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		2	0	0	0	0	0	2
24	බංගලා භාරකරු සහායක	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
25	කාර්යාල කාර්ය සහයක	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
26	බංගලා භාරකාරු සහයක (වාරිකාරාම)	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
27	මුරකරු (මූලටියන)	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
28	කම්කරු (මූලටියන)	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
29	ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක සහයක	PL 1-2016	දෙපාර්තමේන්තුගත	ප්‍රාථමික		1	0	0	1	0	0	0
එකතුව						**849**	**3**	**0**	**756**	**2**	**3**	**91**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	20	16	4
තෘතික	1	1	0
ද්විතික	790	711	79
සුළු	41	33	8

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය

- ප්‍රධාන කර්තෘ හා නියෝජ්‍ය කර්තෘ/සහකාර කර්තෘ තනතුරු - 03 කොන්ත්‍රාත් පදනම මත අනුමත කර ඇත.
- අංක 24 සිට 29 දක්වා තනතුරු තනතුර දරන්නාට පෞද්ගලික වනසේ අනුමත කර ඇත. එම තනතුර දරන්නාගෙන් පසු අදාළ තනතුර අහෝසි වන ලෙස අනුමත කර ඇත.
- පුරප්පාඩු පවතින බෞ.කටයුතු සමායෝජක තනතුරු වෙනුවෙන් නව පත්විම් ලබන සංවර්ධන නිළධාරීන් බඳවා ගනු ලැබේ.

.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
ධාරිතා සංවර්ධන වැඩසටහන	එක් සේවකයෙක්	දින 38	0.00	-	දේශීය	රාජ්‍ය පරිපාලනය, ප්‍රසම්පාදනය , දත්ත විශ්ලේෂණය , රාජ්‍ය මූල්‍ය පිලිබඳ අවබෝධයක් ලබා දීම, මෘදු කුසලතා සංවර්ධනය
ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිලිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	එක් සේවකයෙක්	දින 01	120,000.00	-	දේශීය	ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිලිබඳ අවබෝධයක් ලබා දීම
මෙට්‍රොපොලිටන් උසස් අධ්‍යාපන ආයතනය	එක් සේවකයෙක්	දින 03	18,000.00	-	දේශීය	වැටුප් සකස් කිරීම පිලිබඳ පුහුණුව
කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන	සියලුම සේවකයන්	දින 01	33,600.00	-	දේශීය	කාර්යාල ක්‍රම හා ඵලදායිතාවය පිලිබඳ දැනුම
මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව	එක් සේවකයෙක්	-	100,000.00	-	දේශීය	මානව සම්පත් කළමනාකරණය පිලිබඳ දැනුම

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	√		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	√		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	√		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම**			
3.1	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	√		
3.2	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	√		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	√		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	√		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	√		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	√		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	√		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	X	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා නැත	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සැපයීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී නිලධාරීන් දැනුවත් කරන ලදී
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	√		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර සිටීම	√		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	√		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 1-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්ලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්ලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම	√		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර සිටීම	√		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	X	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අපහරණය කිරීම් සම්බන්ධ කටයුතු ප්‍රමාද වීම	විෂය භාර නිලධාරින්ව දැනුවත් කර ඒ සඳහා අවශ්‍ය මහ පෙන්වීම් සිදු කර ඇත
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	√		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	√		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	X	එවැනි තත්වයේ වාහන නොතිබිණි	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	√		
9.5	2016.06.29 දිනැති අංක2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	√		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	√		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	√		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්දයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	√		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	√		
12	**රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	√		
12.2	හිඟ හිටි ණය ශේෂ පිලිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	√		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	X	සේවය අතහැර ගිය නිලධාරියෙකුගේ හා මරණ පාරිතෝෂික මුදලින් ණයශේෂය අය කර ගැනීමට අදාල ශේෂ ඇත	නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	√		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලින කර පවත්වාගෙන යාම	√		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	√		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	√		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	√		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	√		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම	√		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	X	අදාළ නොවේ	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	√		
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	√		
16.3	**20.09.2017** දිනැති **MSD** චක්‍රලේඛ අංක **04/2017** ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතඉදිරිපත් කර තිබීම	√		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	√		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ **08** වන හා **10** වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	√		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක **05/2018** හා **05/2018(1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18.2	**එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම**	√		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	**2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම**	√		
19.2	**කාර්යමණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අඩුම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම**	√		
19.3	**ඉහත චක්‍රලේඛනයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම**	√		
19.4	**ඉහත චක්‍රලේඛ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමපිලිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම**	√		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	**ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම**	√		